
هذا هو الإسلام - سنهالي

# ඉස්ලාම් ඔබ අමතයි



تعاوني الزلفي

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالزلفي

هاتف: ٤٢٣٤٤٦٦ ٠١٦ - فاكس: ٤٢٣٤٤٧٧ ٠١٦

91

# هذا هو الإسلام

أعده وترجمه للغة السنهالية

**شعبة توعية الجاليات بالزلفي**

**الطبعة الأولى: ١٤٢٢/٩**

ح شعبة توعية الجاليات بالزلفي ، ١٤٢٢ هـ

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

شعبة توعية الجاليات (الزلفي)

هذا هو الإسلام – الرياض .

... ص ؛.. سم

ردمك : ١-٨-٠ ـ٨٦٤-٩٩٦٠

(النص باللغة السنهالية )

١ - الإسلام          أ- العنوان

د يوي ٢١٠          ٢٢/ ٤٣١٩

رقم الإيداع: ٢٢/٤٣١٩

ردمك: ١-٨-٠-٨٦٤-٩٩٦٠

الصف والإخراج: **شعبة توعية الجاليات بالزلفي**

# هذا هو الإسلام

# ඉස්ලාම් ඔබ අමතයි

## ප්‍රාරම්භය

මිනිසා තමා ජීවත්වන මෙම පොළෝ තලය ගැන සිතනවිටද, දීප්තිමත් තාරකාවන් පැහැදිලි පිළිවෙතින් පාවෙමින් පවතින අහස, විශාල කඳු, ඇලදොළ, ගංගාවන්, විවධ ගස් වර්ග, කෘෂි කර්මාන්ත, ජලය, සුළඟ, මුහුදු, ගොඩ බිම්, දිවා රාත්‍රිය යනාදීන් මගින් අලංකාරවත් මෙළොව දකිනවිටද මේ සියල්ල නිර්මාණය කළේ කවරෙකුද ? යන ප්‍රශ්නය මඟුට මතුවේ.

මිනිස් ජීවිතයට අත්‍යවශ්‍ය දෙයක්වූ ජලය අහසේ සිට පහළ කරන්නේ කවරෙකුද ? එමගින් පැළෑටි වර්ග, ගස්, මල් හා පළ තුරු වර්ග (පොළොවෙන්) බිහි කරන්නේ කවරෙකුද ? එමගින් මිනිසුන් හා සත්තුන්ට පානය කරවන්නේ කවරෙකුද? එම ජලය විනාශ නොවී (ප්‍රයෝජනව) පැවතීම සඳහා පොළව සකස් කළේ කවරෙකුද ?.

සෑම ද්‍රව්‍යයන්ටම ඒවාටම සුදුසු හා ඔබින ප්‍රමාණ ආකර්ෂණීය ශක්තිය පොළෝ තලයට ලබා දුන්නේ කවරෙකුද ? මක්නිසාද යත්, එම ආකර්ෂණීය ශක්තිය අධිකවීමෙන් එම ද්‍රව්‍යයන් චලන යවීමට නොහැකි ස්ථාවරයකින් පවතින අතරම, එම ශක්තිය ඌණවූයේනම්, එම ද්‍රව්‍යයන් පොළොවේ රැඳී නොසිට ඉගිලෙමින් පවතී.

මිනිසා නිර්මාණය කර, මඟුව අලංකාරමත් රූපයට පරිවර්තනය කළේ කවරෙකුද ?.

මිනිසා සිය ආත්මය ගැන සිතුවිට ඔහු පුදුමයට පත්වේ. ඔබ එක්තරා පිළිවෙතින් ක්‍රියා කරන, ඔබේ ශරීරයෙහි ඇති විවිධ අවයවයන් කෙරෙහි අවධානය යොමුකර සිතා බලන්න. ඒ අවයවයන්හි ක්‍රියාවන් ගැන ඔබ දන්නේ ස්වල්පයකි. ඒවා පිළිබඳ තීන්දුවක් කිරීමට ඔබට හැකියාවක් නොමැත්තේය.

ඔබ ආශ්වාස ප්‍රශ්වාස කරන සුළඟ කෙරෙහි ඔබේ සිත්සතන යොමුකර බලන්න. එම ආශ්වාස ප්‍රශ්වාසය (හුස්මය) තත්රයක් නැවතුනුවිට ඔබේ ජීවිතය ඔබට අහිමිවේවි. මෙය ඔබට ලබා දුන්නේ කවරෙකුද ?.

ඔබ පානය කරන ජලය, ඔබ අනුභව කරන ආහාර, ඔබ ගැවසෙන මෙම පොළෝ තලය, ඔබ දකින අහස, ඔබට දීප්තිමත් ආලෝකය ලබා දෙන ඉර හා ඔබ ඇසින් දකින හඳ, තාරකා යනාදීන් කෙරෙහි ඔබේ අවධානය යොමුකර සිතා බලන්න. මේ සියල්ල මවා නිර්මාණය කළේ කවරෙකුද ?.

නිසැකයෙන්ම, ඔහු අල්ලාහ් නම්වූ දෙවියා හා මෙම විශ්වය හා එහි සියලු දේ මවා නිර්මාණය කළ අල්ලාහ්ය. ඔහු විශ්වයෙහි සැම දේම පාලනය හා පරිපාලනය කරන ඒකකයාය. ඔබ මවා නිර්මාණය කළේද, ඔබට ආහාර පාන සපයන්නේද, ඔබට පණ පොවා ඔබව ජීවත් කරවන්නේද, පසුව ඔබගේ පණ ඔබෙන් වෙන්කර ඔබගේ ජීවිතය ඔබට අහිමි කරන්නේද ඔහුමයවේ. පෙර නොමැති මෙම විශ්වය නිර්මාණය කළ පරිදි පෙර නොසිටි ඔබව නිර්මාණය කළේ ඔහුය.

මේ සියල්ල කෙරෙහි අවධානය යොමුකර සිතා බැලීමෙන් පසු, මෙම විශ්වය හා එහි ඇති සැම දේ මවා නිර්මාණය කර ඇත්තේ නිශ්ප්‍රයෝජනයට බව බුද්ධිමතෙකුට සිතිය හැකිද ? මිනිසුන් උපත ලද මේ පොළෝ තලය මත ස්වල්ප කාලයක් ජීවත්වී පසුව මරණයට පත්වෙති. මේ සමග සියලු කාර්යයන්

අවසන්වේ. කරුණු මෙසේනම්, මෙහි යථාර්තය කුමක්ද ? අපව, මානව සංහතියෙහි නිර්මාණය කළේ කුමක්නිසාද ?

# මිනිස් නිර්මාණය කුමක් සඳහාද ?

අල්ලාහ් මිනිසා මවා නිර්මාණය කළේ, ඔහුට පමණක් හැර අන් කිසියම් දෙයකට හෝ වන්දනාමානය නොකිරීම සඳහාය. එනම්, ඔහුට පමණක් වන්දනාමානය කිරීම සඳහාය. ඔහු වන් දනාමානය කිරීමේ ක්‍රමය පැහැදිලි කිරීම සඳහා මිනිස් සංහතිය කරා රසූල් හෙවත් පණිවිඩ කරුවන්ද කුතුබ් හෙවත් ධර්ම ග්‍රන් ථද පහළ කළේය. කවරෙකු ඔහුට වන්දනාමානය කර ඔහුට කීකරුවී ඔහු වැළැක්වූ දේ වැළකී සිටියේද, ඔහුට අල්ලාහ්ගෙ තෘප්තිය ලැබේවි. එසේම, කවරෙකු ඔහුට වන්දනාමානය කිරීම ප්‍රතික්ශේප කරමින් ඔහුගේ අණට විරුද්ධකම් කරන්නේද, ඔහු අල්ලාහ්ගේ කෝපයට හා දඬුවමට පාත්‍රවේවි.

නිසැකයෙන්ම, අල්ලාහ් මෙලොව අමල් හෙවත් ක්‍රියවන් හා පරීක්ෂාවට අයත් ස්ථානයක් ලෙස බිහි කළේය. මෙලොවෙහි ජීවත්වන මිනිසුන් සීමිත කාලයකින් පසු මරණයට පත්වෙති. පසුව අල්ලාහ් මිනිසුන්ගේ ක්‍රියාවන් පිළිබඳව ප්‍රශ්න කිරීම හා එයට අදාල කුලිය (දායාදය හෝ දඬුවම) පිරිනැමීම සඳහා අව සාන දිනයේ ඔවුන් සැම දෙනාට නැවත පණ පොවා නැගිට්ටු වන්නේය.

එහි කිසිදු ඇසක් නොදුටු, කිසිදු නැනක් නොඇසූ හා කිසි යම් මිනිස් සිතෙහි වර්ණනා නොවූ දායාදයන් හා භාග්‍යයන් පිරි ස්වර්ගයක් පිහිටා ඇත. එය අල්ලාහ්ව විශ්වාස කර ඔහුගේ අණට වහල්වී ජීවත්වූ විශ්වාසීන් සඳහා ඔහු නිර්මාණය කර ඇත. එසේම, කිසියම් මිනිස් සිතට නොහැඟන විවිධ දඬු වම් හා වේදනා සහිත අපායයක් පිහිටා ඇත. එය අල්ලාහ්ට

ප්‍රතික්ෂේපකර, ඔහු හැර අන් කිසියම් දෙයට හෝ වන්දනාමා නය කර හා ඉස්ලාම් ධර්මයෙහි කරුණු පිටුපා මෙලොවෙහි කරුණු කෙරෙහි වහල්වී ජීවත්වූවන් සඳහා ඔහු නිර්මාණය කර ඇත.

# ඉස්ලාමය යනු කුමක්ද ?

ඉස්ලාම් යනු, අල්ලාහ් විසින් තෝරා ගනු ලැබූ දීන් හෙවත් ජීවිත මගෙකි. එය අල්ලාහ්ට පමණක් වන්දනාමානය කිරීම හා නබි මුහම්මද් (සල්) තුමාව පිළිපැදීමකි. අල්ලාහ් කිසියම් පුද් ගලයෙකුගෙන් හෝ ඉස්ලාමය හැර කිසියම් ධර්මයක් ජීවන මගක් ලෙස පිළි නොගනී. ඉස්ලාම් ධර්මය කිසියම් කෙනෙකුට පමණක් සීමාවූ මගක් නොවන අතර, එය විශ්වයේ සියලුම ජනයාට පොදුවූ ජීවන මගකි.

නිසැකයෙන්ම, අල්ලාහ් තම දාසයන්වූ මිනිස් සංහතිය කරා අප්‍රමාණ අණ කිරීම් යොමුකර ඇති අතර, සමහර කාර්යයන් ඔවුන්ට තහනම් කර ඇත. කවරෙකු ඔහුට වහල්වී ජීවත් වන්නේද, ඔහු ජයග්‍රාහිකයාය. එසේම, කවරෙකු ඔහු ප්‍රතික්ශේප කර ඔහුට විරුද්ධකම් කරන්නේද, ඔහු අලාභය හා විනාශයට පත් අවාසනා වන්තයාය. ඉස්ලාම් ධර්මය නවකවූ ධර්මයක් නොවේ. එය මේ පොළෝ තලය මත මිනිස් ජීවිතය උදාවූ දා සිට තම මැවීම්වූ මානව සංහතිය වෙනුවෙන් අල්ලාහ් තෝරාගත් ධර්මයෙකි.

# මිනිස් සංහතියේ ඉතිහාසය

අල්ලාහ් මිනිස් වර්ගයේ පියානන්වූ නබි ආදම් (අලෛ) තුමා මැවූ දා සිට මිනිස් සංහතියේ ඉතිහාසය ආරම්භ වේ. අල්ලාහ්

ඔහුව මැටියෙන් මවා, ඔහුට රූහ් හෙවත් පණ පොවා ලොවෙහි සැම දෙයෙහි නම් ඔහුට ඉගැන්වූවාය. පසුව, ඔහුට ගරු කිරීම සඳහා සජ්දා හෙවත් ගෞරවාචාරය කරන ලෙස මලක්වරුන් හෙවත් සුරදූතවරුන්ට අල්ලාහ් අණ කළේය. සැම මලක්වරුන්ම එම අණට කීකරුවී හිස නමා ගෞරවාචාරය කළහ. නමුත්, ඉබ්ලීස් හෙවත් සාතාන් පමණක් ආදම් නබිතුමා කෙරෙහි ඊර්ෂ්‍යයා කරමින් අල්ලාහ්ගේ අණට කීකරු නොවී අහංකාර කමින් වැළකී සිටියේය. එබැවින්, අල්ලාහ් ඔහුව අහස් ලොව කරා විසිකර, නින්දිතයෙකු හා දුර්භාග්‍ය වන්තයෙකු ලෙස පිටත් කරමින්, ඔහුට ශාපය, දුර්භාග්‍ය හා අපාය නීන්දු කළේය. එවිට ඉබ්ලීස් තමාට අවසාන දිනය තෙක් අවකාස ලබා දෙන මෙන් අල්ලාහ්ගෙන් අයැද සිටියේය. ඒ අනුව අල්ලාහ් ඔහුට අවකාස ලබා දුන්නේය. එවිට ඉබ්ලීස් 'ආදම්ගේ පරම්පරාවම මංමුලාවට පත්කරන බව' දිවුරා ප්‍රකාශ කළේය.

පසුව, අල්ලාහ් ( මි තම ජීවිතයේ ප්‍රීතිය භුක්ති විඳීම සඳහා ඔහුගෙන් සිට ඔහුගේ බිරියවූ හව්වා මාතාව නිර්මාණයකර, මිනිස් සිතෙන් සිතා වටහා ගැනීමට නොහැකි දායාදයන් හා භාග්‍යයන් සතු ස්වර්ගයෙහි ජීවත්වන ලෙස ඔවුන් දෙදෙනාට අණ කළේය.

අල්ලාහ් ඉබ්ලීස් හා ඔහුගේ සතුරුකම ගැනද ඔවුන්ට පැහැ දිලි කළේය. ඔවුන්ව පරීක්ෂාවට ලක්කරමින් සොදිසි කිරීම සඳහා ස්වර්ගයෙහි එක් ගසක් ගැන අවවාදකර එයින් කිසිවක් අනුභව නොකරමින් වැළකී සිටින ලෙස අණ කළේය. නමුත්, ඉබ්ලීස් ඔවුන්ගේ සිත්සතන්තුල නපුරු සැක ඇතිකරමින්, එම ගසෙන් අනුභව කිරීම පිළිබඳව අලංකාරකර පෙන්නුම් කළේය. මා ඔබලාට යහපත් ලැබීම කෙරෙහි දේශනා කරන්නෙකු බව දිවුරා ප්‍රකාශ කරමින්, 'ඔබලා මෙම ගසෙන් අනුභව කළේනම් ඔබලා මෙහි නිරන්තරයෙන්ම ජීවත්වීමට හැක' යනුවෙන් කිය.

ඉබ්ලීස් ඔවුන් දෙදෙනා මංමුලාවන තෙක් ඔවුන් සමග සිටීය. ඔවුන් දෙදෙනා එම ගසෙන් අනුභවකර තම දෙවියාට විරුද්ධ කම් කළහ. පසුව ඔවුන් තමන් කළ ක්‍රියාව ගැන ඉමහත් කණ ගාටුවට පත්වී, තම දෙවියා කෙරෙහි පාපොච්චාරණයෙහි යෙදී සිටීහ. අල්ලාහ්ද ඔවුන්ගේ පාපොච්චාරණය පිළිගනිමින් ඔවුන්ට පව් සමාව ලබා දුන්නේය. නමුත්, ඔවුන්ව ස්වර්ගයෙන් සිට ඉවත් කර මෙම පොළෝ තලයට යැව්වේය. පසුව නබි ආදම් හා ඔහු ගේ බිරිය පොළොවෙහි ජීවත් වන්නට වූහ. අල්ලාහ් ඔවුන්ට අධික පරම්පරාවක් ලබා දුන්නේය. එම පරම්පරාව අද තෙක් විවිධ ගෝත්‍රයන් ලෙස ජීවත් වෙමින් සිටින්නෝය.

ආදම්ගේ පරම්පරාවවූ මානව සංහතිය අවසන් දිනයේදී අපාය යටම පිවිසිය යුතුයි යන පටු චේතනාවෙන්, ඔවුන් සුමගෙන් ඉවත් කිරීම, කුසල් ක්‍රියාවෙන් වැළකීම, අකුසල් ක්‍රියාවන් අලං කාර කිරීම හා අල්ලාහ්ගේ තෘප්තිය ලැබෙන කාර්යයෙන් ඈත් කිරීම යනාදී කරුණු කෙරෙහි මිනිසුන්ට ඉබ්ලීස් නිතර බාධා කරමින් සිටින්නේය. නමුත්, අල්ලාහ් තම මැවිල්ලන් නොමග නොයාම සඳහා ඔවුන්ට සත්‍යතාවය පැහැදිළි කරන, ඔවුන්ගේ ජයග්‍රහණය සඳහා සුමගෙහි යොමුකරන රසූල් හෙවත් පණිවිඩ කරුවන් ඔවුන් කරා එව්වේය.

ආදම් නබිතුමාගේ අභාවයෙන් පසු දශක, ශත වර්ෂ (Ten century) කාල පරිච්ඡේදයක් ඔහුගේ පරම්පරාව අල්ලාහ්ගේ අණට කීකරුවී ඒක දේවත්වයෙහි ජීවත්වූහ. පසුව ඔවුන් අතර වන්දනාමානයෙහි ෂිර්ක් හෙවත් අල්ලාහ්ගේ වන්දනාමාන බල මහිමයට යමක් සමාන කිරීම් ඇති විය. ඔවුහු අල්ලාහ් සමග ඔහු නොවන වෙනත් දේටද වන්දනාමානය කළහ. මිනිසුන් පිළි යන් වැඳීමට පටන් ගත්හ. එනිසා අල්ලාහ් ඔවුන් කරා තම ප්‍රථම රසූල් හෙවත් පණිවිඩකරුවා වශයෙන් නබි නූහ් (අලෛ) නාමාව එව්වේය. එතුමා අල්ලාහ්ට වන්දනාමානය කිරීම කෙරෙහි

මිනිසුන්ට කැඳවීම් කළේය. පිළිමයන්ට වන්දනාමානය කිරීම තුරන් කළේය.

නූහ් නබිතුමාගෙන් පසු නබි හෙවත් වක්තෘවරුන්ගේ පැමිණීම අඛණ්ඩව පැවැතිය. ඔවුන් අල්ලාහ්ට පමණක් වන්දනාමානය කිරීම හා ඔහු හැර අන් කිසියම් දේ කෙරෙහි කරන වන්දනාමානයන් තුරන් කිරීම යන පදනම මත ඉස්ලාම්හි මූල ධර්මය කරා මිනිසුන් කැඳවූහ. පසුව නබි (ඇබ්‍රහාම්) ඉබ්රාහීම් (අලෛ) තුමා තම සමාජය පිලිම වැඳුම තුරන් කිරීම හා වැඳුම් පිදුම්වලින් අල්ලාහ් පමණක් ඒකත්වය කිරීම කෙරෙහි කැඳවීය. එතුමාගෙන් පසු නබිත්වය නබි (ඉස්මවේල්) ඉස්මායීල් (අලෛ) තුමාටද, පසුව නබි ඉස්හාක් (අලෛ) තුමාටද පසුව නබි ඉස්හාක් (අලෛ) තුමාගේ පරම්පරාවටද ලැබිණ. නබි ඉස්හාක් (අලෛ) තුමාගේ පරම්පරාවෙහි යඃකූබ් (අලෛ), යූසුෆ් (අලෛ), මූසා (අලෛ), දාවූද් (අලෛ), සුලයිමාන් (අලෛ), හා ඊසා (අලෛ) යන්නන් විශිෂ්ඨ නබිවරුන්වූහ. නබි ඊසා (අලෛ) තුමාගෙන් පසු ඉස්හාක් නබිතුමාගේ පරම්පරාවෙන් කිසියම් නබිවරයෙකු හෝ නොපැමිණීය. එතුමාගේ පරම්පරාවෙහි පැවැති නබිත්වය පසුව ඉස්මාඊල් නබිතුමාගේ පරම්පරාවට මාරුවිය.

අල්ලාහ් මෙම පරම්පරාවෙන් නබිවරුන් හෙවත් වක්තෘවරුන්ගේ හා රසූල්වරුන් හෙවත් දූතවරුන්ගේ අවසාන මුද්‍රාවක් වශයෙන් නබි මුහම්මද් (සල්) තුමාව තොරා ගත්තේය. එතුමාගේ රිසාලත් දර්ශනය අවසාන දර්ශනයක් වශයෙන්ද, එතුමා වෙත පහළවූ ධර්ම ග්‍රන්ථයවූ අල්කුර්ආනය අල්ලාහ් විසින් මිනිස් සංහතියට පහළ කළ අවසන් පණිවිඩ වශයෙන්ද පත්විය.

එබැවින්, නබි මුහම්මද් (සල්) තුමාගේ දර්ශනය, මිනිස් හා ජින් වර්ගයන්ට, අරාබි හා අරාබි නොවන්නන්ට, සැම කාලයට, සැම ප්‍රදේශයට, සැම සමාජයන්ට හා සැම අවස්ථාවන්ට ඔබින හා උචිතව සියලුම දේ අඩංගු පරිපූරණත්වයෙන් පහළවිය. එම

දර්ශනය අඩංගු අල්කුර්ආනය දේශනා කරන දේට වඩා කිසිදු යහපතක් හෝ කුසලක්ද, එය අවවාද කරන දේට වඩා කිසිදු අයහපතක් හෝ අකුසලක්ද නොමැත.

# නබි මුහම්මදු (සල්) තුමා

අල්ලාහ් මුහම්මද් (සල්) තුමාව රසූල් හෙවත් පණිවිඩකරුවන් ගේ අවසන් වන්නයා වශයෙන් එවූ අතර, එතුමාගේ දර්ශනය අවසාන දර්ශනය වශයෙන්ද පත් කළේය.

අල්ලාහ්ට පමණක් වන්දනාමානය කිරීම හා එයට විරුද්ධව මිනිසුන් වන්දනාමානය කරන පිලිම වැඳුම හා මෙවැනි කාර්ය යන් සියල්ල තුරන් කිරීම තුලින් මිනිස් සමාජය සුමගට යොමු කිරීම සඳහා අල්ලාහ් එතුමාව එව්වේය.

නබි මුහම්මද් (සල්) තුමා, මහුගේ හතලිස්වන වියේදී වක්තෘ වරයෙකු වශයෙන් මක්කාවට එවන ලද්දේය. නබිත්වයට පත්වී මට පෙරද එතුමා තම සමාජය අතර ගෞරවනීය වන්තයෙකු වශ යෙන්ද යහපත් ගුණාංගයන්හි මිනිස් සංහතියේම උසස් වන්තයා වශයෙන්ද පත්ව සිටියේය. එතුමා සත්‍යතාවයෙන්ද, විශ්වාස භාව යෙන්ද, උසස් ශීලාචාරයෙන් ශ්‍රේෂ්ඨයා ලෙසද හැඳින්වූ නිසා තම සමාජයින් විශ්වාසනීය (අල් අමීන්) පුද්ගලයා යන සංඥා නාම යෙන් කැඳවන්නට වූහ.

එතුමා කියවීමට හෝ ලියවීමට හෝ නොදන්නා උම්මි ලෙස සිටිය. අල්ලාහ් එතුමාට ශුද්ධවූ අල්කුර්ආන් නම්වූ ධර්ම ග්‍රන්ථය පහළ කළේය. අල්ලාහ් මුලු මිනිස් සංහතියගෙන්ම 'හැකිනම් මෙවැනි ග්‍රන්ථයක් ගෙනෙන' ලෙස අභියෝග කරන්නේය.

# පරම්පරාව හා ජීවිතය

නබි මුහම්මද් (සල්) තුමා, නබි ඉබ්රාහීම් (අලෙ) තුමාගේ පුත්‍රයාවූ ඉස්මායිල් (අලෙ) තුමාගේ පරපුරෙහි හාෂිම්ගේ පුත්‍ර යාවන අබ්දුල් මුත්තලිබ්ගේ පුත්‍රයාවූ අබ්දුල්ලාහ්ගේ පුත්‍රයාය. එතුමාගේ මව, සහ්රාගේ පුත්‍රයාවූ අබ්දුල් මනාෆ්ගේ පුත්‍රයාවන වහබ්ගේ දියණියවූ ආමිනාය. සහ්රා නබිනායක තුමාගේ සීයා ගේ සහෝදරයාය.

නබිතුමාගේ පියා අබ්දුල්ලාහ්, ආමිනා හා සමග විවාහවී සුළු කාලයක් ඇය සමග ජීවිතය ගත කළේය. ඒ අතර ඇය ගැබිණි යක් බවට පත්වීය. ඇය ගැබ් ගැනීමෙන් කිසිදු අසීරුථවයට පත් නොවීය. ඇය, ක්‍රිස්තු වර්ෂ 571 හි සෞන්දර්‍යමත් රූපයෙන් හා ආරෝග්‍යමත් දේහයෙන් යුත් නබිතුමාව ජනිත කළාය.

එතුමා තම මවගේ ගර්භාශයෙහි සිටින අවස්ථාවේ පියා අබ් දුල්ලාහ් මරණයට පත්වීය. එනිසා එතුමාගේ සීයාවූ අබ්දුල් මුත් තලිබ් එතුමාට භාරකරුවෙකු ලෙස ඉදිරිපත්වී රැකවරණය දී ඇතිකරන්නට වීය. එතුමා මවගෙන් දින තුනක් මව්කිරි පානය කළේය. පසුව අබ්දුල් මුත්තලිබ් එතුමාට මව්කිරි දීම සඳහා හලී මතුස් සඃදියියා නම්වූ ගැමි ස්ත්‍රීය වෙතට භාර කළේය. අරාබි ඵංැත් තම දරුවන්ගේ ශක්තිමත් ශරීර වර්ධනය සඳහා ඔවුන්ට මව්කිරි දීම සඳහා ගැමියන්ගෙන් ඉල්ලා සිටීම සිරිතක් ලෙස පැවැත්විණ.

හලීමතුස් සඃදියියා නබිතුමාට මව්කිරි දීමේ කාර්යයෙහි පුදුම යක් දිටීය. ඇය මක්කාවට තම සැමියා සමග සෙමින් ගමන් කරන අසරණ කෙට්ටු කොටළුවෙක් මත පැමිණිය. නමුත් මක් කාවෙන් සිට ආපසු පිටත්වන අවස්ථාවේ නබිතුමාව තම ඔඩක්කු වෙහි තබාගෙන ගියේය. සෙමින් ගමන් කළ කොටළුවා වේග යෙන් ගමන් කර, අන් සියලු වාහන පසුකර අභිබවා යන්නට

වීය. මගෙහි (රොත්තපිටින්) ගිය වාහන හිමියන් මේ ගැන ඉමහත් පුදුමයට පත්වූහ.

'තම තනයෙහි කිරි ස්වල්පයක් පමණක් එරීම නිසා තම දරුවා අධික කුස ගින්නට පත්ව සැමදා අඬමින් සිටිය. නමුත්, තම තනයෙන් නබිතුමාට කිරි පෙවීමෙන් පසු තම තනයෙන් කිරි එරෙන්නට පටන් ගත්තේය. එනිසා ඇය නබිතුමාට හා තම දරුවාට කුස පිරෙන තරමට කිරි පෙවීමට සමත්විය' යනුවෙන්ද, 'නබිතුමාට මව්කිරි දීමේ විශිෂ්ඨ භාග්‍ය ලැබීමෙන් බණූ සඅද් ගෝත්‍රයේ වියලී තත්ත්වයෙහි පවතී තම ඉඩම හා සිව්පාවන් සාරවත්වූ අතර, තම දිළිඳුකම් හා අසරණකම් සියල්ල පොහොසත් තත්ත්වයට පරිවර්තනයවූ බවද ඇය පවසන්නීය.

වසර දෙකකින් පසු හලීමා, නබිතුමාව මක්කාවෙහි සිටින එතුමාගේ මව වෙත කැඳවාගෙන ගොස් එතුමාගේ භාග්‍යයෙන් තමාට සිදුවූ වෙනස්වීම් ගැන සිතූ ඇය දෙවැනි වරටත් එතුමාව තම රැකවරණයේ රඳවා ගැනීමට එකඟවන ලෙස ආමිනාගෙන් බලවත් ඉල්ලීමක් කළේය. එයට ආමිනාද එකඟවීය. හලීමා තම සිත් තුල ඉමහත් ප්‍රීතිය පිරිවරමින් එම දරුවාව නැවත වරක් රැගෙන බණූ සඅද් ගෝත්‍රයෙහි තම නිවස බලා ආපසු පැමිණිය.

මින් දෙවසරකින් පසු එනම්, නබිතුමාගේ සිව්වැනි වියේදී හලීමා එතුමාව සිය මවවන ආමිනා වෙත භාර කළේය. ආමිනා තමා මරණයට පත්වන තෙක් එනම්, නබිතුමාගේ හයවැනි විය තෙක් රැකවරණය ලබා දුන්නාය. ආමිනාගේ මරණයෙන් පසුව එතුමාගේ සීයාවූ අබ්දුල් මුත්තලිබ්ද, මහුගේ මරණයෙන් පසු ලොකු තාත්තාවූ අබූතාලිබ්ද එතුමාට රැකවරණය ලබා දුන්නේය. අබූතාලිබ් ආර්ථික වශයෙන් දිළිඳුකමින් සිටියද, එතුමාව තම දරුවන් සේම රැකවරණය ලබාදී ඇති කළේය, එහෙයින්, එතුමා ආඩම්බර ජීවිතයට යොමු නොවීය.

නබිතුමා තම කිරි සහෝදරයින් සමග බණු සඃද් ගෝත්‍රයන් වසන ගම්මානවල බැටළුවන් බලා ගැනීමට අදහස් කළ නිසා, මක්කා වාසීන්ගේ බැටළුවන් බලා ගැනීමට පටන් ගත්තේය. එතුමා එමගින් තමාට ලැබෙන කුලිය තම ලොකු පියාවූ අබූ තාලිබ්ට ලබා දුන්නේය.

පසුව එතුමා තම දොළොස්වැනි වියේදී තම ලොකු පියා අබූ තාලිබ් සමග වෙළඳ කටයුතු සඳහා සිරියා (ෂාම්) දේශය කරා ගමන් කළේය. පසුව මක්කා නගරයේ ධනවත් ස්ත්‍රියවූ කුවයිලිද්ගේ දියණියවන කදීජාගේ වෙළඳ භාන්ඩ රැගෙන එතුමා නැවත වරක් වෙළඳාම සඳහා පිටත්විය. එතුමා වෙළඳ කටයුතු අවසන්කර, ලාභය දෙගුණකර පැමිණීම නිසා, කදීජා එතුමාට අන් අයට ලබා දෙන කුලියට වඩා වැඩි කුලියක් ලබා දුන්නේය.

කදීජාගේ වහළාවූ මෛසරා නබිතුමා සමග කළ සිරියා ගමනේදී ඇය එතුමාගෙන් දුටු විශිෂ්ට යහපත් ගුණාංග හා උසස් ශ්‍රේෂ්ටභාවය පිළිබඳව කදීජාට පැහැදිලි කළේය. එයින් කදීජාට එතුමා පිළිබඳ තද ඇල්මක් ඇතිවී, එතුමාව තම සැමියා ලෙසට පත් කිරීමට අදහස් කළේය. කදීජා මීට පෙර විවාහවී සැමියා අන්තරාවූ කාන්තාවකි. එබැවින්, නබිතුමා හා කදීජා අතර භාග්‍යමත් විවාහය සිදුවිය. එවිට නබිතුමා විසිපස් වියට පත්ව සිටී අතර කදීජා හතලිස් වන වියට සමීපව පත්ව සිටියාය.

නබිතුමා හතලිස්වන වියට ලංවන විට තනියමින් කාලය ගත කිරීමට අදහස් කළ බැවින්, මක්කාවෙන් පිට පිහිටා ඇති හිරා නම්වූ කඳු ගුහාවෙ තනියමින් හා අසාමානයෙන් සිටින්නට විය. එහි අධික රාත්‍රීන් රැඳී සිට වන්දනාමානය කළේය. පසුව, ආපසු නිවසට පැමිණ (නැවත එහි යාම සඳහා) ආහාර පානයන් පිළියෙල කරන්නට විය.

දිනක් එතුමා හිරා ගුහාවෙහි සිටියදී මලක් හෙවත් සුරදූත වරයාවූ ජිබ්රීල් (අලෛ) තුමා අහසෙන් සිට පැමිණ, 'ඉක්රඋ-

පාරායනය කරන්න' යනුවෙන් පැවැසීය. එතුමා 'මා පාරායනය කිරීමට නොදනිමි' යනුවෙන් කීය. දෙවැනි වරටත් 'ඉක්රඋ- පාරායනය කරන්න' යනුවෙන් පැවැසීය. එතුමාද 'මා පාරායනය කිරීමට නොදනිමි' යනුවෙන් කීය. තෙවැනි වරටත් 'ඉක්රඋ- පාරායනය කරන්න' යනුවෙන් පැවැසීය. එයටද එතුමා 'මා පාරා යනය කිරීමට නොදනිමි' යනුවෙන් කීය. නබිතුමාගේ සෑම පිළි තුරකින් පසුම ජිබ්රීල් (අලෛ) තුමා, නබිතුමා අසීරුථාවයට පත්වන තරමට තම පපුව මත තදකරමින් ආලිංගනය කළේය. තෙවැනි වතාව මෙසේ ආලිංගනය කර අතහැරීමෙන් පසු, එතුමා අල්කුර්ආනයෙහි ප්‍රථමයෙන් පහළවූ පහත සඳහන් වැකිය පාරා යනා කළේය.

﴿اقرأ باسم ربك الذي خلق ، خلق الإنسان من علق ، اقرأ وربك الأكرم ، الذي علم بالقلم ، علم الإنسان مالم يعلم﴾ [العلق : ١-٥]

සෑම දේ මවා නිර්මාණය කළ ඔබ දෙවියාගේ නාමයෙන් පාරා යනා කරන්න. මහු අලක් යනු ස්ථාවරයේ සිට මිනිසා මවා නිර් මාණය කළේය. පාරායනා කරන්න. ඔබ දෙවියා ඉතා දානවන්ත යාය. මහු පෑනය මගින් මිනිසා නොදන්නා දේ සියල්ලම මහුට ඉගැන්වීය. *(අල්කුර්ආන්-96:1-5)*

අල්ලාහ්ගෙන් සිට වහි හෙවත් දේව හෙළිදරව්ව නබි මුහම් මදු (සල්) තුමාට පහළවීම ආරම්භ වූයේද, අධ්‍යාපනික දැනුම් ඥානය ලබාගැනීම කෙරෙහි අණකරන හා මිනිස් නිර්මානයේ ආරම්භය ගැන පැහැදිළි කරන මෙම වදන් මගින්ය.

හිරා ගුහාවෙන් සිට නබිතුමා බියෙන් වැවුලන සිතින් තම බිරිඳ කදීජා (රලි) තුමිය වෙත ආපසු පැමිණ, මාව පොරවන්න, මාව පොරවන්න යනුවෙන් කීය. එතුමා බියෙන් මිදෙන තෙක් පොරවා තැබුවාය. එතුමා තමාට සිදුවූ දේ ගැන කදීජා (රලි)

තුමියට පැහැදිළිකර, තමා තම ජීවිතය ගැනද බියවන බව පැවැසීය. එයට කදීජා (රලි) තුමිය 'එසේ නොව, අල්ලාහ් මත දිවුරා කියමි. අල්ලාහ් ඔබතුමාට කිසි දිනක නින්දා නොකරයි. නිසැකයෙන්ම, ඔබතුමා ඥාතීන් සමග එක්ව සිටින්නේය. දුෂ්කරතාව යන් ඉවසා සිටින්නේය. නැති බැරි අයට උපයා දෙන්නේය. අමුත්තන් සළකා ගරු කරන්නේය යථාර්තයෙන් අසීරුතාවයට පත් අසරණයන්ට උපකාර කරන්නේය' යනුවෙන් කීය.

පසු දිනක් සුරදූතවර ජිබ්රීල් (අලෛ) තුමා නබිතුමා වෙත දෙවැනි වරටත් පැමිණියේය. මෙය නබිතුමා දිනක් 'මා ඇවිදමින් සිටින විට අහසෙන් ශබ්දයක් ඇසින. මා දෑස් ඔසවා බැලුවිට හිරා ගුහාවෙහි මා වෙත පැමිණ සුර දූතයාව දිටිමි. එවිගස මා බියට පත්වුයෙමි. නමුත්, එය ප්‍රථම වතාවේ මා බියට පත්වූ සේ නොවෙය' යනුවෙන් පැවැසීය. පසුව එතුමා තම නිවසට පැමිණ පොරෝනයකින් පොරවාගෙන සිටීය. පසුව පහත සඳහන් දේව වදන පහළවීය.

﴿يا أيها المدثر، قم فأنذر، وربك فكبر، وثيابك فطهر، والرجز فاهجر﴾

[المدثر : ١-٥]

(පොරෝනයකින්) පොරවමින් සිටින්නාණෙනි, ඔබ නැගිට (මිනිසුන්හට) අවවාද කරන්න. ඔබ දෙවියාව (ශ්‍රේෂ්ඨභාවයෙන්) ආඩම්බර කරන්න. තවද, ඔබගේ ඇඳුම් පැළඳුම් පවිත්‍රභාවයෙන් තබා ගන්න. තවද, අපවිත්‍රකම පිළිකුල් කරන්න.

*(අල්කුර්ආන්-74:1-5)*

මෙහි තේරුම, '(පොරෝනයකින්) පොරවමින් සිටින නබිතුමනී, ඔබ නැගිට, අල්කුර්ආනය ගැන මිනිසුන්ට අවවාදකර, අල් ලාහ් කරා කැඳවීමේ කාර්ය මවුන් අතර පතුරුවන්න. අපවිත්‍රතාවයෙන් සිට ඔබ ඇඳුම් පැළඳුම් පවිත්‍රකර සිටින අතර. පිළිම වැඳුම (වන්දනාමානය කිරීම) පිළිකුල් කරන්න' යන්නේය.

පසුව වහි හෙවත් දේව හෙළිදරව්ව අඛණ්ඩව පහළවීය. අල්ලාහ් නබි මුහම්මද් (සල්) තුමාට අල්ලාහ්ට පමණක් වන්දනාමානය කිරීම කෙරෙහි හා ලෝවැසියන් වෙනුවෙන් අල්ලාහ් විසින් පිළිගනු ලැබූ ඉස්ලාම් ධර්මය කරා කැඳවන මෙන් අණ කළේය. එනිසා නබි මුහම්මද් (සල්) තුමා සූක්ෂ්ම භාවයෙන් හා යහපත් දේශනා මාර්ගයෙන් කැඳවීමට පටන් ගත්තේය.

නබි මුහම්මද් (සල්) තුමාගේ මෙම කැඳවීමට ස්ත්‍රීන්ගෙන් කදීජා (රලි) තුමියද, පිරිමින්ගෙන් අබූබක්ර් සිද්දීක් (රලි) තුමාද, කොල්ලන්ගෙන් එතුමාගේ ලොකු පියාගේ පුත්‍රයාවූ අලි බින් අබී තාලිබ් (රලි) තුමාද සවන්දී පිළිගත්හ. පසුව, මිනිසුන් ඉස්ලාම් ධර්මය කරා අඛණ්ඩව පිවිසීමට පටන් ගත්හ. එනිසා මුෂ්රික් වරුන් හෙවත් වන්දනාමානය කිරීමෙහි අල්ලාහ්ට සමාන කරන්නන්ගේ හිරිහැර එතුමාට උග්‍රව සිදුවන්නට විය.

එතුමා මක්කාවෙහි දහතුන් (13) වසරක කාලයක් කැඳවීමේ කාර්යයෙහි අඛණ්ඩව නිරතවී සිටියේය. එතුමාට හා එතුමාගේ සහාබා හෙවත් ශ්‍රාවකරුවන්ට කාෆිර්වරුන් (ප්‍රතික්ෂේප කරන්නන්)ගේ හිරිහැර අධිකවන්නට විය. එනිසා එතුමා තම ශ්‍රාවකරුවන් සමඟ මදීනාව කරා හිජ්රත් (පලා) යන්නට වූහ. වසර කිහිපයකින් පසු ආපසු මක්කාවට පැමිණෙන තෙක් එතුමා මදීනාවේ කැඳවීම් කාර්යයෙහි නිරතවී සිටීය. පසුව තම පවුලේ ඥාතීන් සැම දෙනා ඉස්ලාම් ධර්මය කරා පිවිසෙන්නට වූහ.

නබිත්වයට පෙර හතලිස් (40) වසරක්ද, මින් පසු නබිවරයා වශයෙන් විසිතුන් (23) වසරක්ද තම ජීවිතය ගත කළ නබි මුහම්මද් (සල්) තුමා තම හැටතුන් (63) වියේදී අභාවයට පත්විය. අල්ලාහ්, එතුමාගෙන් රිසාලත් හෙවත් දර්ශනය අවසන් කළේය. විශ්වයේ මානව සංහතියට එතුමාව පිළිපැදීම අනිවාර්ය කළේය.

කවරෙකු එතුමාව ආදර්ශයට ගෙන පිළිපදින්නේද, ඔහු මෙලොවෙහි භාග්‍ය වන්තයාවන අතර, පරලොවෙහි ස්වර්ගය දායාදයක් ලෙස ලබන්නෙකු වෙයි. කවරෙක එතුමාව ප්‍රතික්ශේපකර, එතුමාට විරුද්ධකම් කරන්නේද, ඔහු මෙලොවෙහි දුර්භාග්‍ය වන්තයාවන අතර, පරලොවෙහි අපාය දායාදයක් ලෙස ලබයි.

එතුමාගේ වියෝවෙන් පසු එතුමාගේ සහාබා හෙවත් ශ්‍රාවකරුවන් එතුමාගේ මාර්ගය අනුගමනය කළහ. එතුමා කළ කැඳවීමේ කාර්ය ප්‍රචාරය කරමින් ලොවෙහි ඉස්ලාම් ධර්මය පතුරන්නට වූහ.

# නබිතුමාගේ ගුණාංග

නබි මුහම්මද් (සල්) තුමා මිනිසුන් අතර ඉමහත් ගුණාංග ශීලයා ලෙස සිටියේය. නබිත්වයට පෙරද එතුමා මෙම ගුණාංගයෙන් විශිෂ්ට වශයෙන් හැඳින්විය. නබිත්වයට පසු මෙම ගුණාංග වර්ධනය වන්නට විය. අල්ලාහ් තආලා අල්කුර්ආනයෙහි එතුමා ගැන මෙසේ පවසන්නේය.

﴿إنك لعلى خلق عظيم﴾ [القلم : ٤]

(නබිතුමනී) ඔබ උතුම්වූ ගුණාංග ශීලයෙන් සිටින්නේය.

*(අල්කුර්ආන්-68:4)*

එතුමා මිනිසුන් යහපත් ගුණාංග ශීලය කරා කැඳවීය. කුමන ශ්‍රේෂ්ට ගුණාංගයන් කරා එතුමා තම සහාබාවරුන් කැඳවූයේද, එතුමා ඔවුන් අතර එම ගුණාංගයන්හි ආදර්ශ වන්තයා ලෙස සිටීය. එතුමා තමා අණකරන නීතිරීතීන් හා දේශනා ඔවුන් අතර වැපිරීමට පෙර, උතුම් ගුණාංගයන් තම ජීවිතයෙහි අනුගමනය කිරීම මගින් ඔවුන් අතර වැපුරුවේය.

නබිතුමාගේ ශ්‍රාවකරුවෙක්වූ අනස් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[خدمت النبي ﷺ عشر سنين ، والله ما قال لي : أف قط ، ولا قال لشيء لم فعلت كذا ؟ وهلا فعلت كذا ؟] (رواه مسلم)

මා නබි මුහම්මද් (සල්) තුමාට වසර දහයක කාලයක් සේවක යෙකු ලෙෂ කටයුතු කළෙමි. එතුමා මාහට කිසිදු අවස්ථාවක 'චී' යනුවෙන් පිළිකුල් ලෙෂ නොකිව්වේය. කිසියම් කාර්යයක් පිළිබඳව ඇයි මෙසේ කළේ? ඇයි මෙසේ නොකළේ? යනුවෙන් ද නොඇසීය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

[كنت أمشي مع رسول الله ﷺ وعليه برد غليظ الحاشية ، فأدركه أعرابي فجبذه جبذة شديدة، حتى نظرت في صفحة عاتق رسول الله وقد أثرت به حاشية البرد من شدة الجبذة ، ثم قال : يا محمد مرلي من مال الله الذي عندك ! فالتفت إليه رسول الله، وضحك ، وأمر له بعطاء] (رواه البخاري)

මා නබිතුමා සමග ගමනක යෙදී සිටියෙමි. එතුමා මත මහත දාර (වාට්ටි)යෙන් යුත් පොරෝනාවක් තිබිණ. එම අවස්ථාවෙහි එහි පැමිණ ගැමියෙකු, පොරෝනාව අල්ලා තදෙන් ඇද්දේය. මා එතුමාගේ උරහිස බැලීමි. පොරෝනාව තදෙන් ඇදූ නිසා එහි දාරයේ සළකුණ පෙණිත. පසුව ඔහු 'මුහම්මද්, ඔබ සතුව ඇති අල්ලාහ්ගේ සම්පත් වලින් මාහට නිකුත් කරන ලෙස අණ කරන්න' යනුවෙන් කීය. එවිට එතුමා ඔහු කරා බලා සිනහවී, ඔහුට එයින් නිකුත් කරන මෙන් අණ කළේය.
*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබිතුමාගේ බිරිඳ ආයිෂා (රලි) තුමියගෙන් නබිතුමා තම නිවසෙහි කුමණ කාර්යයෙහි යෙදෙන්නේද? යනුවෙන් අසන ලද්දේය. එයට එතුමිය 'එතුමා නිවැස් කටයුතුවලින් (තමාගේ බිරිඳන්ට) සහාය දක්වන්නේය. සලාතයෙ (නැමදුමෙ)හි වේලාව

පැමිණ විගස වුව හෙවත් දෝවනයකර සලාතය සඳහා පිටත්වන් නේය' යනුවෙන් පැවසුවාය.

අබ්දුල්ලාහ් බින් හාරිද් (රලි) තුමා නබිනායක තුමා ගැන මෙසේ වාර්තා කරන්නේය.

[ما رأيت أحدا أكثر تبسما من رسول الله ﷺ] (رواه الترمذي)

නබි මුහම්මද් (සල්) තුමාට වඩා මද සිනහවන කිසිදු පුද්ගල යෙකු හෝ මා නොදිටිමි. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමාගේ විශිෂ්ට පෞද්ගලිකත්වය ප්‍රසිද්ධියකි. කිසියම් දෙයකින් හෝ ලෝභකමක් නොකරන ධානවන් තයා ලෙසද, සත්‍යභාවයට පිටුපා නොයන ධෛර්ය වන්තයා ලෙසද, ප්‍රශ්නවලදී තීන්දු කරනවිට කිසිවිටක හෝ අසාධාරණය නොකරන නීති ගරුක පුද්ගලයා ලෙසද, තම මුලු ජීවිතයෙහිම සත්‍ය වන්තයා හා නම්බුකාරයා ලෙසද සිටියේය.

නබි මුහම්මදු තුමාගේ ශ්‍රාවකරුවකුවන අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[ما سئل النبي ﷺ فقال لا] (رواه البخاري ومسلم)

නබි මුහම්මද් (සල්) තුමාගෙන් කිසියම් දෙයක් හෝ අයැද, එතුමා එය නොමැති බව කිසිදු අවස්ථාවක නොපැවැසුවේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මද් (සල්) තුමා, තමාද මවුන් සේම සහෝදරයෙකු ලෙස සිතමින් තම ශ්‍රාවකරුවන් සමග එකට එක්වී විහිළුවෙහි යෙදෙන්නේය. මවුන්ගේ දරුවන් සුරතල්කර විනෝද කරන් නේය. දරුවන් තමාගේ ඔඩොක්කුවෙහි වාඩි කරවා ගන්නේය. ආගන්තුක සංග්‍රහය හා මිතිසුන්ගේ අවශ්‍යථාවන් සඳහා තමාට කෙරෙන ඇරයුම් පිළිගන්නෙකු ලෙසද, රෝගීන්ගේ ලෙඩ දුක් ගැන විමසන්නෙකු ලෙසද, තමන්ගෙන් සිදුවන වැරදීම් සඳහා

ඔවුන් පවසන නිදහසට කරුණු පිළිගන්නෙකු ලෙසද සිටියේය. එතුමා තම ශ්‍රාවකරුවන් ඔවුන් ප්‍රියවන නම්වලින් කැඳවන්නේය. ඔවුන් කිසි කෙනෙකුගේ කථාබහලට බාධා නොකරන්නේය.

නජ්ජාෂී රජුගේ දූත පිරිස පැමිණ අවස්ථාවේ නබි මුහම්මද් (සල්) තුමා ඔවුන්ට ආවතේව කරන්නට විය. එවිට එතුමාගේ ශ්‍රාව කරුවෙකු 'ඔබතුමා වෙනුවෙන් (ඔවුන්ට ආවතේව කිරීමට) අපි සිටින්නෙමු' යනුවෙන් කීය. එයට එතුමා 'ඔවුහු අප සහෝදර යන්ට ගරු කළහ. එනිසා මා ඔවුන්ට ආවතේව කිරීමට ප්‍රියවෙමි' යනුවෙන් පැවැසීය.

නබි මුහම්මද් (සල්) තුමා 'නියත වශයෙන්ම, මා දාසයෙකු ආහාරපාන අනුභව කරන සේම ආහාර පාන අනුභව කරන හා දාසයෙකු අසුන්ගන්නා සේම අසුන්ගන්නා දාසයෙකි' යනු වෙන් පවසන්නේය. එතුමා බූරුවා මත ගමන් කරන්නේය. දුප්පතුන්ගේ ලෙඩ දුක් විමසන්නේය. දුළින්දන් හා සමග එකට වාඩිවී පරස්පරයෙන් හැසිරෙන්නේය.

ප්‍රකට දර්ශන විශාරද තෝමස් කර්ලිල් (Thomas Curlil) තම අල්-අබ්තාල් (විශිෂ්ට ප්‍රකට විශාරදයින්) යන ග්‍රන්තයෙහි නබි මුහම්මද් (සල්) තුමා ගැන ක්‍රිස්තියානි සමාජය අමතා දීර්ග වශයෙන් කරුණු පහදා ප්‍රකාශ කරයි. ඔහු එම ග්‍රන්ථයෙහි 'කව රෙකු මෙම කාලයේ ඉස්ලාම් ධර්මය අසත්‍ය බවත්, නබි මුහම් මදු (සල්) තුමා අසත්‍ය හා වංචාකරුවා බවත් දොස් කියන්නන්ට කන්දී අසා සිටින්නේද, ඔහු ඉමහත් වැරදි සහගත හා ඌණතා පුද්ගලයෙකු බවට සැළෙකේ' යනුවෙන් පවසයි.

## නබිතුමාගේ ආශ්චර්යයන්

නිසැකයෙන්ම, භාෂා ශෛල්‍ය පණ්ඩිතයින් පවා අසමත් කළ නබිතුමාට පහළවූ ශ්‍රේෂ්ඨ අල්කුර්ආනය විශිෂ්ට ආශ්චර්යයෙකි.

අල්ලාහ් මෙම අල්කුර්ආනයෙහි ඇති එක් පරිච්ඡේදයක් හෝ ගෙනෙන ලෙස මානව සංහතිය අමතා අභියෝග කරන්නේය. කුෆ්ෆාර් හෙවත් ප්‍රතික්ශේප කරන්නන් මෙම අභියෝගයට මුහුණ දීමට නොහැකි බව පිළිගත්හ. මෙම අභියෝගය සදා කාලීනව පවතින්නේය.

මක්කාවෙහි විසූ කාෆිර්වරුන් මුහම්මද් (සල්) තුමාගෙන් චන්ද්‍රයා දෙකට පළා පෙන්වන මෙන් අභියෝග කළ විට, එතුමා අල්ලාහ්ගෙන් මේ පිළිබඳව ප්‍රාර්ථනා කළේය. එවිගස චන්ද්‍රයා කොටස් දෙකට පැළීය. එතුමාගේ ඇඟිලි අතරෙහි සිට කීප වතාවක් ජලය උනන්නට වීය. එතුමාගේ අතෙහි තිබූ ගලක් අල්ලාහ්ව තස්බීහ් (ප්‍රශංසා) කළේය. එතුමාට වහදී ඝාතනය කිරීම සඳහා යහුදි (යුදෙව්) කාන්තාවක් ත්‍යාග කළ වහ තැවූ එළු මස් එතුමා සමග කථා කළේය.

එක් ගැමි අරාබිවරයෙක් නබිතුමාගෙන් තමාට සාධකයක් පෙන්වන මෙන් අයැද සිටි කළ එතුමා ගලකට අණ කළේය. එය පැමිණියේය. පසු නැවත එයට අණ කළේය. එය ආපසු තම ස්ථානයට ගියේය. කිරි නැති එළුවකුගේ කිරි බුරුල්ල එතුමා තමතින් පිරිමැද්දීය. එහි කිරි එරෙන්නට වීය. එයින් එතුමා කිරි දොවා තමාද පානය කර, තම මිත්‍රයා අබූබක්ර් (රළි) තුමාටද පානය කිරීමට ලබා දුන්නේය. අලී බින් අබීතාලිබ් (රළි) තුමාගේ ඇස් රෝගයට පත්වූ අවස්ථාවේ නබිතුමා තම කෙළ ඔහුගේ ඇසෙහි පිරිමැද්දීය. එවිගසම එය සුවවිය. එක් සහාබිවරයෙකුගේ කකුලෙහි තුවාලයක් සිදුවූවිට නබිතුමා එම ස්ථානය පිරිමැද්දීය. එවිගසම එය සුවවිය.

නබිතුමා තම සහාබා වරයෙකුවූ අනස් බින් මාලික් (රළි) තුමාට දීර්ඝායුෂය, අධික සම්පත්, අධික දරුවන් හා පොහොසත් කම (බරකත්) ලබාදෙන ලෙස ප්‍රාර්ථනා කළේය. ඔහුට දරුවන්

120 දෙනෙක් ඉපදීය. ඔහුගේ රටඉඳි ගස්වල වසරකට දෙවරක් ගෙඩි හැදෙන්නට විය. රටඉඳි ගස්වල පොදුවෙන් වසරකට එක් වරක් පමණක් ගෙඩි හැදීම සිරිතකි. ඔහු වසර 120 ක කාලයක් ජීවත්විය.

නබිතුමා (දිනක්) මිම්බර්හි (දේශනා කුටියෙහි) සිට දේශනා කළ අවස්ථාවේ මිනිසුන් (එවිට පැවැති) සාගතය පිළිබඳව එතුමාට පැමිණිලි කළහ. එතුමා අල්ලාහ් වෙත ප්‍රාර්ථනා කළේය. එවිට වලාකුළු නොතිබූ අහසේ වහාම කඳු සේ වලාකුළු නැගිට ඊළඟ ජුම්ආ දිනය (සිකුරාදා) තෙක් තද වර්ෂාවක් වහින්නට විය. (නැවත ඔවුන්) අධික වැස්ස පිළිබඳව එතුමාට පැමිණිලි කළහ. එතුමා අල්ලාහ් වෙත ප්‍රාර්ථනා කළ විගස වැස්ස නැවතීය. මිනිසුන් ඉර උෂ්ණයෙහි ඇවිදමින් පිටත්වන්නට වූහ.

නබි මුහම්මද් (සල්) තුමා කන්දක් (යුද්ධයට සහභාගිවූ) වැසියන් දහස් දෙනාට තිරිඟු පිටි 'සාඅකින්' (සාමාන්‍යයෙන් කිලෝ දෙකහමාරක ප්‍රමාණයකින්) හා එළු මස් ස්වල්පයකින් ආහාර සැපයීය. ඔවුන් කුස පිරෙන්නට අනුභව කරමින් පිටත් වූහ. නමුදු, එම ආහාරය සුළුවෙන් හෝ අඩු නොවිය.

නබි (සල්) තුමාව ඝාතනය කිරීම සඳහා එතුමාගේ නිවස වට කරමින් සිටි කුරෙයිෂිවරුන් 100 දෙනාගේ ඉදිරියෙහි ඔවුන්ගේ මුහුණු මත පස් ඉසමින් පිටත්ව ගියේය. ඔවුහු එතුමාව නොදිටීය. එසේම, නබිතුමා ඝාතනය කිරීම සඳහා සුරාකා බින් මාලික් එතුමා පසු පස්සෙන් ලුහු බැඳමින් ගියේය. නබිතුමා වෙත ළඟාවූ විට එතුමා ඔහුට එරෙහිව ප්‍රාර්ථනා කළේය. එවිගස ඔහු පැමිණි අශ්වයාගේ කකුලු පොළොවහි එරෙන්නට විය.

නබි මුහම්මද් (සල්) තුමාගේ ආශ්චර්යයන් ඉතාමත් අධිකය. මේවා සියල්ල එතුමාගේ රිසාලත් (දූතත්වයෙ)හි සත්‍යභාවය තහවුරු කිරීම සඳහා අල්ලාහ් එතුමාට පිරිනැමූ දායාදයන්ය.

# ඉස්ලාම් ධර්මයෙහි පදනම

## අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම

අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම ඉස්ලාම් ධර්මයෙහි මූලිකත් වයකි. අල්ලාහ් විශ්වාස කිරීම යනුවෙන් හැඳින්වන්නේ, අල්ලාහ් සිටින බව ස්ථිර වශයෙන් විශ්වාස කිරීමකි. ඔහු සෑම දෙනා පෝෂණය කරන්නා හා පාලනය කරන්නාද, සියලු මැවිල්ලක්ම මැවූ එකම මවන්නාද, මෙම විශ්වය පාලනය කරන්නාදවේ. කිසි යම් සහකරුවෙකු හා සමාන කරුවෙකු නොමැති, සියලු වන්ද නාමාන බල මහිමයට හා ඇඳහීම්වලට සුදුසු එකම තැනැත්තා හෙතම ඔහුමය. ඔහු ගුණවත්කමෙන් හා ශිලාචාරකමෙන් පරි පූරණවූ හා සෑම අඩුපාඩු හා ඌණතාවයෙන් පවිත්‍රවූ කෙනෙකි. ඔහු කිසියම් මැවිල්ලකට හෝ සමාන නොවන්නෙකි.

කවරෙකු මෙම විශ්වය හා එහි ඇති විවිධ මැවීම් කෙරෙහි තම සිත යොමුකර සිටින්නේනම්, ඒ කිසිවක් ස්වභාවයෙන් ඇති නොවූ බවද කිසියම් මවන්නෙක මගින් තොරව ඒවා නිර්මාණය නොවූ බවද, ඒ සියල්ල මවන ලද්දේ අල්ලාහ් විසින් බවද ඔහුට දැන ගැනීමට හැකිවේ.

## මලක්වරුන් විශ්වාස කිරීම

මලක් හෙවත් සුරදූතවරුන් ගුප්ත ලෝකයෙහි සිටින පිරි සකි. ඔවුහු අල්ලාහ්ට වන්දනාමානය කිරීම සඳහා මවනලද අයයි. ඔවුන්ට මවා පෝෂනය කරන ශක්තියක්ද, වන්දනාමාන යට සුදුසුකමක්ද ඔවුන්ට නොමැත. අල්ලාහ් ඔවුන්ට තම අණට සම්පූර්ණයෙන් කීකරුවී පිළිපැදීමේ ස්වභාවයද, ඒවා නිසියාකා රව ඉටුකිරීමේ ශක්තියද ලබාදී ඇත.

මුස්ලිම්වරයා, මලක්වරුන් සිටින බවද, මවුන් අල්ලාහ් පම ණක් දැන සිටින අප්‍රමාණ හා අධික සංඛ්‍යාවෙන් යුත් මැවිල්ලක් බවද විශ්වාසය කළ යුතුයි. එසේම, අපි දැන සිටින ජිබ්රීල් (අලෛ) තුමා, මාලික් (අලෛ) තුමා, මීකායිල් (අලෛ) තුමා හා වෙනත් මලක්වරුන් ගැනද මවුන්ගේ ගුණාංගයන් හා ක්‍රියාවන් ගැනද විශ්වාස කළ යුතුයි.

# ධර්ම ග්‍රන්ථ විශ්වාස කිරීම

සැබවින්ම, අල්ලාහ්, සත්‍යතාවය මානව සංහතියට පැහැදිලි කර, එය කරා මවුන් කැඳවීම සඳහා සමහර පැරණි නබි හෙවත් වක්තෘ වරුන්ට හා රසූල් හෙවත් පණිවිඩ කරුවන්ට තව්රාතය, ඉන්ජීලය හා සබූරය යනාදි ධර්ම ග්‍රන්ථයන් පහළ කළ බව මුස්ලිම් වරයා විශ්වාස කළ යුතුයි. එසේම, අවසාන නබිවරායාවූ මුහම්මද් (සල්) තුමාට අල්ලාහ් පහළ කළ අල්කුර්ආනය ගැනද විශ්වාස කළ යුතුයි.

# අල්කුර්ආන්

අල්කුර්ආනය මානව සංහතිය කරා අල්ලාහ් පහළ කළ අව සාන රිසාලත් හෙවත් පණිවිඩ ග්‍රන්ථයකි. අල්ලාහ්, මෙම අල් කුර්ආනය නොපවසන පරිදි කරන කිසියම් කෙනෙකුගේ ක්‍රියාවන් පිළිගනු නොලැබේ. මෙම කුර්ආනය පැරණි ධර්ම ග්‍රන්ථයන් සත්‍යකර ආරක්ෂා කරයි. අල්කුර්ආනයෙහි කිසියම් ඇතුලත් කිරීමක් හෝ වෙනස් කිරීමක් ඇතුල් නොවන සේ ආරක්ෂා කරන බව අල්ලාහ් තහවුරු කිරීම මගින් මෙය විශිෂ්ඨයෙන් පවතී. නමුත්, පැරණි ධර්ම ග්‍රන්ථයන් ඇතුලත් කිරීම් හා වෙනස් කිරීම් රාශියකට ලක්විය. මක්නිසාද යත්, අල්ලාහ් අල්කුර්ආනය සේ ඒවා ආරක්ෂා කරන බවට තහවුරු නොකළේය.

අල්කුර්ආනය සාහිත්‍යය ක්ෂේත්‍රයෙහි ශාස්ත්‍රීය භාෂා විලාශ යෙන් හා ඉතා අලංකාරවත් නිර්මාණයෙන්ද, ෂරීආ හෙවත් නීති ක්ෂේත්‍රයෙහි ඉතා පරිපූරණවත් නීති පද්ධතියෙන්ද පව තින්නේය. අල්කුර්ආනය වන්දනාමානයට අදාල තත්ත්වයෙහි හා ගුප්තවූ ආරංචියන්හි කිසියම් මිනිසෙකු නොදන්නා හා මිනිස් බුද්ධියෙන් වටහා ගැනීමට නොහැකි කරුණු ලබා දෙන්නේය.

තවද, අල්කුර්ආනය නබි මුහම්මද් (සල්) තුමාගේ කාල පරිච් ඡේදයෙහිද, එතුමාගෙන් පසුවූ රළඟ කාල පරිච්ඡේදයෙහිද, මින් පසුවූ රළඟ දසක ශත වර්ෂයෙහිද කිසියම් කෙනෙකු හෝ නොදන්නා දර්ශණයන් හා යථාර්තයන් කරා ස්වභාව යෙන්ම උපුටා පෙන්වයි. නබි (සල්) තුමාගෙන් පසු එනම්, වසර එක්දහස් තුන්සිය (1300) කට පසු සිදුවන දර්ශණයන් කරාද මෙය සංඥා කරයි.

අල්කුර්ආනය, අල්ලාහ් විසින් මානව සංහතිය කරා 'හැකි නම් මෙවන් පරිච්ඡේද දහයක් හෝ නොඑසේනම්, එක් පරිච් ඡේදයක් හෝ ගෙනෙන' ලෙස අභියෝග කර ඇති ධර්ම ග්‍රන්ථයෙකි. නමුත් මානව සංහතියම මෙම අභියෝගය පිළි ගෙන මුහුණ දීමට අසමත් වූහ. මෙම අල්ලාහ්ගේ අභියෝග යද, එය පිළිගැනීමට නොහැකි අසමත්කමද අද තෙක් අඛණ් ඩව පවතී.

අල්කුර්ආනයේ ආශ්චර්යභාවය ස්ථිරයෙන් පැවැතීමකි. නමුදු ආශ්චර්යභාවයෙහි ස්ථාවරය වචනවලට පමණක් හෝ ගුප් තවූ කරුණු පිළිබඳ දැනුම්දීම පමණක් හෝ එය පවසන ෂරී අත් නම් නීති පද්ධතිය පමණක් හෝ සීමාවූ එකක් නොවන් නේය. නමුත්, එහි සැම දේ සම්පූර්ණයෙන්ම එකට අඩංගු වෙන් පවතින්නේය.

# දූතවරුන් විශ්වාස කිරීම

අල්ලාහ්ට පමණක් වන්දනාමානය කිරීම කෙරෙහි මානව සංහතිය කැඳවීම හා එයට විරුද්ධව පවතින සෑම දේ ඉවත් කිරීම සඳහා ඔහු රසූල් හෙවත් දූතවරුන් එවූ බව මුස්ලිම් වරුන් විශ්වාස කළ යුතුයි. ඔවුන්ද අල්ලාහ් විසින්ම මවනලද මිනිසුන්ය. ඔවුන්ට මවා පාලනය කරන බලය හෝ වන්දනාමානයට අදාල බල මහිමය හෝ නොවන අතර, ආහාර පානය කිරීම, ලෙඩවීම හා මරණයට ලක්වීම යනාදී මිනිස් අවශ්‍යතාවයන් ඇත්තේය.

රසූල්වරුන් මිනිසුන් අතර ශ්‍රේෂ්ට පුද්ගලයන් වන අතර, අල්ලාහ් ඔවුන්ව තෝරාගෙන රිසාලත් නම්වූ දූතත්ත්වය පිරිනමා ශ්‍රේෂ්ට කළේය. එතුමන්ලාගේ දූතත්ත්වය සත්‍ය කිරීම මගින් ඔවුන් විශ්වාස කළ යුතු අතර, ඔවුන්ගෙන් අපි නම් වශයෙන් දැන සිටින අය ගැනද විශ්වාස කළ යුතුයි. තවද, එතුමන්ලා ගෙන ආ පණිවිඩ සත්‍ය කරන කරුණු සියල්ල විශ්වාස කරන අතර, ඔවුන්ගෙන් අවසාන වන්නායාවූ නබි මුහම්මද් (සල්) තුමාගේ ෂරීඅතය හෙවත් නීති සෙත්‍රය පමණක් අනුගමනය කළ යුතුයි. කුමක්නිසාදයත්, අල්ලාහ් එතුමාව පහළ කළේයින් පසු එතුමාගේ ෂරීඅතය හැර වෙනත් කිසිදු ෂරීඅතයක් ඔහු පිළිනොගන්නේය.

# අවසාන දිනය විශ්වාස කිරීම

අවසන් දිනය යනුවෙන් හඳුන්වන්නේ, විශ්වයේ ජීවත්වූ සෑම මිනිසුන්ම ඔවුන් ලොවෙහි කළ ක්‍රියාවන් ගැන ප්‍රශ්න කිරීම හා එයට අදාල සුදුසු කුලිය පිරිනැමීම සඳහා ඔවුන්ට නැවත පණ පොවා නැගිට්ටවන දිනයෙකි. මේදින අවසාන දිනය යනු නමින් හැඳින්වන්නේ, එයට පසු වෙනත් දිනයක් නොවන නිසාය. මක් නිසාදයත්, මෙම දිනයෙහි ප්‍රශ්නකර කුලිය පිරිනැමීමෙන් පසු,

ස්වර්ග හා අපාය වාසීන් තම තමන්ගේ ස්ථානයෙන්හි ස්ථිරව රැඳී සිටිති.

අවසාන දිනය ගැන විශ්වාස කිරීමෙහි තේරුම වන්නේ, එම දිනය පැමිණෙන බව ස්ථිරයෙන්ම සත්‍යකර, එම දින(යෙහි ජය ග්‍රහණ)ය සඳහා කුසල් ක්‍රියාවන්හි යෙදීමකි. අවසාන දිනය පිළි බඳ විශ්වාස කිරීම කරුණු තුනකට සමන්විතවේ. එම කරුණු මෙසේය.

## අ)-නැගිට්ටවීම පිළිබඳ විශ්වාසය

එය නැසීගිය මිනිසුන්ට නැවත පණ පොවා නැගිට්ටවීමකි. එදිනයේ මිනිසුන් තම තමන්ගේ මිනීවළවල සිට පාවහන් නොපැළඳමින්, කත්තා (චර්මඡේදනය) නොකර හා නිර්වස් ත්‍රයෙන් නැගිටිටෙති.

## ආ)-ප්‍රශ්න කිරීම, කුලිය පිරිනැමීම පිළිබඳ විශ්වාසය

මෙලොවෙහි ජීවත්වූ කාලයෙහි සෑම මිනිසෙකුම කළ ක්‍රියා වන් පිළිබඳව අල්ලාහ් ප්‍රශ්න කර, එයට අයත් කුලිය පිරින මයි. කවරෙකු අල්ලාහ්ව විශ්වාසකර. කුසල් ක්‍රියාවන්හි යෙදී සිටියේද, ඔහුට ස්වර්ගයද, කවරෙකු අල්ලාහ්ව ප්‍රතික්ශේප කර, පාප ක්‍රියාවන්හි යෙදී සිටියද, ඔහුට අපායයද පිරිනමනු ලැබේ.

මිනිසාගේ ක්‍රියාවන් පිළිබඳව ප්‍රශ්න කිරීම හා එයට අදාල දායාදයන් හෝ දඬුවම් පිරිනැමීම බුද්ධියෙන් පිළිගත හැකි කරුණකි. මන්ද යත්, නිසැකයෙන්ම. අල්ලාහ් ධර්ම ග්‍රන්ථ පහළකර හා රසූල් හෙවත් පණිවිඩකරුවන් එවා මිනිසුන්ට හොඳ හා නොහොඳ, කුසල් හා අකුසල් පිළිබඳව පැහැදිළි කරමින් ඔහුට අවනතවීම හා වහල්වීම අනිවාර්ය කළේය. නමුත්, මිනිසුන් අල්ලාහ් කෙරෙහි විශ්වාස කරන්නන් හා

ප්‍රතික්ශේප කරන්නන් බවට පත්වූහ. මෙම දෙපිරිස අල්ලාහ් ගේ සූක්ෂ්මභාවය හා නීතිය අනුව කිසිසේත්ම සමාන වන්නයින් නොවෙති. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿أفنجعل المسلمين كالمجرمين ، مالكم كيف تحكمون﴾

[القلم : ٣٥، ٣٦]

අපි මුස්ලිම්වරුන් (පාප ක්‍රියාවන්හි යෙදෙන) වරදකරුවන් ලෙසට පත් කළෙමුද? (සත්‍යතාවය ප්‍රතික්ශේප කරුණි) ඔබලාට කුමක් සිදුවුයේද?, (දෙපිරිසම) සමානවන්නයින් බව ඔබලා කෙසේ විනිශ්චය කරන්නේද ?

*(අල්කුර්ආන්-68:35,36)*

## ඉ)-ස්වර්ගය හා අපාය පිළිබඳ විශ්වාසය

ස්වර්ගය හා අපාය මිනිස් සංහතියට ස්ථිරවූ ස්ථානයන්ය. ස්වර්ගය, අල්ලාහ් තමන්ට කුමක් පිළිබඳව විශ්වාස කළ යුතු බවට අනිවාර්ය කළේද, ඒවා කෙරෙහි විශ්වාස කරමින්, අල්ලාහ්ගේ හා ඔහුගේ දූතයාගේ අණට කීකරුවූ, ඔහු වෙනුවෙන් යනු චිත්ත පාරිශුද්ධියෙන් ක්‍රියා කළ හා දූතවරයාගේ මග අනුගමනය කළ බියභක්තිකයන්වූ විශ්වාසීන්ට ඔහු පිළියෙළකර ඇති දායාදයෙන් හා භාග්‍යයෙන් යුත් නිවැසකි. මිනිසුන් ස්වර්ගයේ ඔවුනොවුන්ගේ කුසල් ක්‍රියාවන්හි තත්ත්වය අනුව විවිධ තරාතිරමෙන් සිටිති.

නිසැකයෙන්ම, අපාය, කවරෙකු අල්ලාහ්ව ප්‍රතික්ශේප කරමින් අපරාධයෙහි යෙදී සිට ඔහුගේ දූතවරයාට විරුද්ධකම් කළේද, එවැනි කාෆිර්වරුන් හෙවත් ප්‍රතික්ශේප කරුවන් වෙනුවෙන් ඔහු පිළියෙළ කර ඇති දඬුවම් සහිත නිවසකි. අපාය විවිධ තරාතිරමෙන් පවතී. අපායවාසීන් ඔවුනොවුන්ගේ අකුසල්හි තත්ත්වය අනුව විවිධ තරාතිරමෙන් සිටිති.

## දෛවය විශ්වාස කිරීම

එනම්, අල්ලාහ් පෙර සිදුවූ, දැනට සිදුවමින් පවතින හා පසුව සිදුවීමට නියමිත කරුණු කෙරෙහි ඥාන වන්තයා බවත්, ඔහු කැමැතිවන දේ සිදුවන බවත්, ඔහු අකැමැතිවන දේ නොසිදුවන බවත්, ඔහුගේ දැනුමෙන් හා කැමැත්තෙන් තොරව කිසියම් දෙයක් හෝ නොසිදුවන බවත් මිනිසා විශ්වාස කිරීමකි.

## ඉස්ලාම්හි වන්දනාමානය

ඉස්ලාම් ධර්මයෙහි කිසියම් වන්දනාමානයක් හෝ අල්ලාහ් වෙනුවෙන් යනු චිත්ත පාරිශුද්ධියෙන් හා නබි මුහම්මදු (සල්) තුමානන් ගෙන ආ සුමගට ඔබින පරිද්දෙන් තොරව පිළිගනු නොලැබේ. උදාහරණයක් වශයෙන්, සලාතය හෙවත් නැමදුම අල්ලාහ්ට පමණක් කළ යුතු හා නබි මුහම්මදු (සල්) තුමා පැහැදිළි කළ ක්‍රමයෙන් තොරව නොකළ යුතු වන්දනාමානයෙකි. මෙයට කාරණා කීපයක් ඇත. ඒවා මෙසේය.

1- නිසැකයෙන්ම, අල්ලාහ් වන්දනාමානයන් සියල්ල ඔහුට පමණක් යනු ඉහ්ලාස් හෙවත් පිරිසිදු චේතනාවෙන් පවතිය යුතු බව අණකර ඇත. ඔහු සමග වෙනත් කිසියම් දෙයකට හෝ කරන වන්දනාමානයන් ෂිර්ක් හෙවත් අල්ලාහ්ගේ වන්දනාමාන බල මහිමයට සමාන කිරීමකි. මේ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿واعبدوا الله ولا تشركوا به﴾ [النساء:٣٦]

තවද, අල්ලාහ්ට (පමණක්) කීකරුවී වහල්වන්න. ඔහු සමග කිසියම් දෙයක් හෝ සමාන නොකරන්න.

*(අල්කුර්ආන් - 4:36)*

2-නිසැකයෙන්ම, අල්ලාහ් නීති සම්පාදන කිරීමේ බලය තමාට පවරා ඇත. එය ඔහුටම අයත් වගකීමකි. කවරෙකු අල්ලාහ් හැර අන් කිසියම් කෙනෙකු හෝ සම්පාදනයකර ඇති වත්පිළිවෙත් මගින් වන්දනාමානය කළේද, නිසැකයෙන්ම, ඔහු අල්ලාහ්ගේ නීති සම්පාදනය කිරීමේ බලයට සමානකම් කළේය.

3- සැබවින්ම, අල්ලාහ් අපට ඉස්ලාම් ධර්මය පරිපූරණත්වයෙන් ලබාදී ඇත. කවරෙකු හෝ සිය මතය පරිදි වන්දනාමානයක් ඇති කළේනම්, එය මෙම ධර්මයෙහි ඌණතායක් ඇති බව දොස් පැවරූ සේ සැළකේ.

4-මිනිසුන්ට තමන් කැමැති දේ හා කැමැති ක්‍රම මගින් වන්දනා මානය කිරීමට හැකි වන්නේනම්, ඔවුනොවුන්ගේ මත විවිධ ආකාරයෙන් පවතින බැවින්, සැම දෙනාටම වන්දනාමාන යෙහි පෞද්ගලික ක්‍රමයන් ඇතිවේවි.

# ඉස්ලාම්හි අනිවාර්ය කරුණු

අල්ලාහ් අණකර ඇති ඉස්ලාම්හි අනිවාර්ය කරුණු පහක්වේ. ඒවා මෙසේය ·

1-වන්දනාමානය කිරීමට සුදුසු එකම දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බවත්, නබි මුහම්මද් (සල්) තුමා අල්ලාහ් ගේ දූතයා බවත් සාක්ෂි දැරීම.

2-සලාතය හෙවත් නැමදුම නිසියාකාරව ඉටු කිරීම.

3-සකාතය හෙවත් දුගී බද්ද අදාල සුදුසුකම්ලාභීන්ට නිසි පරිදි ගෙවීම.

4-රාමසාන් මාසයේ උපවාස ශීලයෙහි යෙදීම.

5-මක්කාවෙහි පිහිටා ඇති බයිතුල්ලාහ් හෙවත් කඃබාවට ගොස් හජ් කර්තව්‍යය ඉටු කිරීම.

# අනිවාර්ය කරුණු පිළිබඳ විස්තර

## 1-සාක්ෂි දැරීම

ලාඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහ්. එනම්, වන්දනා මානය කිරීමට සුදුසු එකම දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බවත්, නබි මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දූතයා බවත් සාක්ෂි දැරීම. මෙලෙස සාක්ෂි දැරීමෙන් හැඳින්වන්නේ, නිසැකයෙන්ම, වන්දනාමානයට අයත් සුදුසු එකම සත්‍ය දෙවියා අල්ලාහ් බවත්, ඔහුට සමානව කිසියම් දෙයක් හෝ නොමැති බවත්, නබි මුහම්මදු (සල්) තුමා ඔහු පිළිබඳ පණිවිඩය මානව සංහතිය කරා පතුරුවන දූතයා බවත් දිවෙන් ප්‍රකාශකර ස්ථිර භාවයෙන් සත්‍යකර විශ්වාස කිරීමකි.

කිසියම් පුද්ගලයකුගේ ඉස්ලාමය හා ක්‍රියාවන් අල්ලාහ් වෙනුවෙන් යනු පිරිසිදු චේතනාවෙන් හා නබිනායක මුහම්මදු (සල්) තුමානන්ගේ මග අනුගමනය කිරීමෙන් තොරව පිළිගනු නොලැබේ.

ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් හඳුන්වන්නේ, වන්දනාමාන යට සුදුසු සත්‍ය එකම දෙවියා අල්ලාහ් පමණක් බව මුවින් ප්‍රකාශ කර, විශ්වාස කිරීමකි. මුවින් ප්‍රකාශ කිරීම පමණක් ප්‍රමාණවත් නොවන්නේය. නමුත්, පිළිගැනීම හා අල්ලාහ්ගේ අණට සම්පූර් ණයෙන්ම කීකරුවීම යනාදි එම වදනෙහි අන්තර්ගතව ඇති කරුණු මගින් ක්‍රියා කිරීම අනිවාර්යවේ.

මුහම්මදුර් රසූලුල්ලාහ් යනුවෙන් හඳුන්වන්නේ, නබි මුහම්මදු (සල්) තුමා අණකළ කරුණු අනුගමනය කිරීම, එතුමා දැනුම් දුන් කරුණු සත්‍ය කිරීම, එතුමා වැළක්වූ හා අවවාද කළ කරුණු වැළකී සිටීම හා එතුමා නීති සම්පාදනය කර අණ කළ කරුණු මගින් පමණක් අල්ලාහ්ට වන්දනාමානය කිරීමකි.

## 2-සලාතය ඉටු කිරීම

ඉස්ලාම් ධර්මයෙහි, මුස්ලිම්වරයෙකු රාත්‍රී හා දහවල් කාලයේ අනිවාර්යයෙන් ඉටුකළ යුතු සලාතයන් හෙවත් නැමදුම් පහක් වේ. ඒවා ෆජ්ර් සලාතය, ලුහර් සලාතය, අස්ර් සලාතය, මග්රිබ් සලාතය, හා ඉෂා සලාතය යනාදීන්ය.

## 3-සකාතය ගෙවීම

සකාතය යනු, තම ධනයෙන් කිසියම් ප්‍රමාණයක් දිළින්දන්, අවශ්‍යවූවන් හා මෙවැනි අයට අනිවාර්ය දානයක් වශයෙන් පිරිනැමීමකි. මෙමගින් ලෝභකමින් ආත්මය පවිත්‍රවීම, උවමනාවූ මුස්ලිම් වරුන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම, ඔවුන් අතර ආදරය හා ප්‍රිය ඇතිවීම, ආත්මාර්ථයෙන් ඈත්වීම, ඊර්ෂයාවෙන් මිදීම, බැගෑපත්කම සහ භාග්‍ය ලැබීම හා අන් මිනිසුන් ගැන හැඟීමක් ඇතිවීම යනාදී ඵල ප්‍රයෝජනයන් සිදුවන්නේය. මෙවන් හේතූන් මත සකාතය ගෙවීම අනිවාර්ය කර ඇත.

## 4-රාමසාන් උපවාස ශීලයේ යෙදීම

මෙය, රමලාන් මාසයේ දහවල් කාලයෙහි උපවාසය නිශ්ඵල කරන කාර්යයෙන් වැළකී සිටීම මගින් අල්ලාහ්ට ඉබාදත් හෙවත් වන්දනාමානය කිරීමකි. එය මුස්ලිම්වරයා අල්ලාහ්ට වන්දනාමානය කිරීමේ චේතනාවෙන් රාමසාන් මාසය පුරා අළුයම සිට ඉර බසින තෙක් ආහාර පානයන් අනුභව කිරීම, සංසර්ගයෙහි යෙදීම හා මෙවැනි උපවාසය නිශ්ඵල කරන කරුණුවලින් වැළකී සිටීමකි.

මෙම උපවාසය මගින් ආත්මය පවිත්‍රවීම, අල්ලාහ්ගේ තෘප්තිය ලබා ගැනීමේ චේතනාවෙන් තමා ප්‍රිය කරන කාර්යයන් පවා ද වැළකී සිටීමේ පුහුණුවක් ලබා ගැනීම හා දුක් පීඩාවන් ඉවසා ඉවසිලි භාවයෙන් සිටීමේ සිරිතට හුරුවීම යනාදී ප්‍රයෝජනයන්

ලැබෙන්නේය. එසේම, උපවාසය අල්ලාහ් වෙනුවෙන් යනු පිරිසිදු චේතනාවෙන් ක්‍රියාවන්හි ඓධ්‍ය ඇතිවීම, විශ්වාසභාවය රැක ගැනීම, පිටස්තර අය පිළිබඳ හැඟීම් ඇතිවීම හා මුලු ශරීරයටම ආරෝග්‍ය ලැබීම යනාදී ඵල ප්‍රයෝජනද ගෙන දෙන්නේය.

## 5-හජ් කර්තව්‍යය ඉටු කිරීම

මෙයින් හැඳින්වන්නේ, ශක්ති වන්තයින් තම ජීවිත කාලයේ වරක් හෝ අල්ලාහ් වෙනුවෙන් යනු චිත්ත පාරිශුද්ධියෙන් හජ් කර්තව්‍යයෙහි සළකුණු චිහ්නයන් පිහිටුවීමේ චේතනාවෙන් මක්කාවෙහි කඃබා නම්වූ දේවස්ථානය කරා ගොස් ඉබාදත් හෙවත් වන්දනාමානය කිරීමකි.

# ඉස්ලාම් ධර්මයෙහි පෞද්ගලිකත්වය

ඉස්ලාම ධර්මය මානව සමාජය වෙනුවෙන් අල්ලාහ් විසින් තෝරා ගන්නාලද සෑම කලකට හා සෑම තැනකට ඔබින හා උචිත ජීවන මගකි. ඉස්ලාම් ධර්මය අණ නොකල කිසියම් කුස ලක් හෝ අවවාද නොකළ කිසියම් අකුසලක් හෝ නොමැත.

මානව සංහතිය ඉස්ලාම් ධර්මය පිළිගෙන සෑම කාර්යයන් කෙරෙහිම එය අනුගමනය කිරීමෙන් තොරව කිසියම් සිත් සැන සීමක් හෝ භාග්‍යයක් හෝ ලැබීමට නොහැක. වෙනත් ධර්ම යන්හි හෝ ප්‍රතිපත්තිවල හෝ නොමැති විශේෂයක් ඉස්ලාම් ධර්මයේ තිබීම එහි උතුම් හා විශේෂභාවය තහවුරු කිරීමකි.

ඉස්ලාමයෙහි පෞද්ගලිකත්වය තහවුරු කරන ශ්‍රේෂ්ඨභාවය හා මිනිසුන් අනුගමනය කළයුතු අවශ්‍යකම පහත සඳහන්වේ.

1-මෙය අල්ලාහ්ගෙන් සිට පහළවූ ධර්මයෙකි. අල්ලාහ් තම දාස යන් ශීලාචාර කිරීම කෙරෙහි ඉමහත් ඥානවන්තයාය. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ألا يعلم من خلق وهو اللطيف الخبير﴾ [الملك:١٤]

(සෑම දේ) නිර්මාණය කළ තැනැත්තා නොදැන සිටින්නේද? ඔහු සූක්ෂ්මයෙන් අවධානය යොමුකර, සෑම දේ පැහැදිළිව දැන සිටින්නාය. *(අල්කුර්ආන්-67:14)*

2-ඉස්ලාමය මිනිසාගේ ආරම්භය, අවසානය හා ඔහුව නිර්මාණය කරන ලද පරමාර්ථය පැහැදිළි කරයි. එසේම, මිනිසා තම මෙලෝ ජීවිතයෙහි අනිවාර්යයෙන් අනුගමනය කළ යුතු මාර්ගය වටහා දෙන අතර, මිනිසා වැළකී සිටිය යුතු කාර්ය යන්ද පැහැදිළි කරයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ياأيها الناس اتقوا ربكم الذي خلقكم من نفس واحدة وخلق منها زوجها وبث منهما رجالا كثيرا ونسآء﴾ [النساء:١]

මිනිසුනි, ඔබලාගේ දෙවියා කෙරෙහි බියෙන් සිටින්න. ඔහු ඔබ සැම දෙනා එක ආත්මයකින් නිර්මාණය කළේය. ඔහුගෙන් සිටම ඔහුගේ බිරිඳද නිර්මාණය කළේය. පසුව මවුන් දෙදෙනා මගින් අධික පිරිමින් හා ස්ත්‍රීන් (පිටත් කරමින් ලොවෙහි) පැතිරවීය. *(අල්කුර්ආන්-4:1)*

﴿منها خلقناكم وفيها نعيدكم ومنها نخرجكم تارة أخرى﴾ [طه-٥٥]

ඔබලාව මෙම පොළොවේ සිටම නිර්මාණය කළෙමු. තවද, ඒ තුළම ඔබලාව ආපසු එවන්නෙමු. තවද, ඔබලාව එහි සිටම නැවත වරක් පිටත් කරන්නෙමු. *(අල්කුර්ආන්-20-55)*

﴿وما خلقت الجن والإ نس إلا ليعبدون﴾ [الذاريات:٥٦]

තවද, ජින් හා මිනිස් වර්ගයන් මාහටම ඉබාදත් (සම්පූර්ණයෙන් අවනතවී මාගේ අණ පිළිගෙන ජීවත්වීමට හා මාහට පමණක් වන්දනාමානය) කිරීමට හැර මා මැවූයේ නැත. *(අල්කුර්ආන්-51:56)*

﴿اليوم أكملت لكم دينكم وأتممت عليكم نعمتي ورضيت لكم الإسلام دينا﴾ [المائدة:٣]

අද දිනයේ ඔබලා වෙනුවෙන් ඔබලාගේ ධර්මය පරිපූරණය කළෙමි. එසේම, ඔබලා වෙත මාගේ භාග්‍යයන් සම්පූර්ණ කළෙමි. තවද, ඔබලා වෙනුවෙන් ඉස්ලාම් ධර්මය (ඔබලාටම ඔබින ලෙස) තෝරා ගත්තෙමි. *(අල්කුර්ආන්-5:3)*

3-ඉස්ලාමය (එහි අර්ථ) පරස්පර විරුද්ධත්වයක් නොමැති ස්ව භාවික ධර්මයෙකි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿فطرة الله التي فطر الناس عليها﴾ [الروم:٣٠]

කුමන (ධර්මයෙ)හි අල්ලාහ් මිනිසාව නිර්මාණය කළේද, එයම ඔහුගේ (ස්ථිර) ස්වභාවික ධර්මයෙකි. *(අල්කුර්ආන්-30:30)*

4-ඉස්ලාමය සිහි බුද්ධියට වටිනාකමක් ලබාදී කල්පනා කිරීමට අණ කරයි. මෝඩකම, අන්ධ භක්තියෙන් පිළිපැදීම, නිසියාකාරව කල්පනා කිරීම පැහැර හැරීම යනාදීන් නින්දා කරයි.

මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ قل هل يستوى الذين يعلمون والذين لايعلمون ، إنما يتذكر اولوا الألباب ﴾ [الزمر:٩]

(නබිතුමනි) ඔබ පවසන්න. දැනුම් ඥානය ලද අයත් දැනුම් ඥානය නොලද අයත් සමාන වන්නෙහිද? නිසැකයෙන්ම, (මෙම අල්කුර්ආනය මගින්) දේශනා ලබන්නන් ඥාන වන්තයින්ය. *(අල්කුර්ආන්-39:9)*

﴿إن في خلق السماوات والأرض واختلاف الليل والنهار لآيات لأولى الألباب، الذين يذكرون الله قياما وقعودا وعلى جنوبهم ويتفكرون في خلق السماوات والأرض ، ربنا ماخلقت هذا باطلا ، سبحانك فقنا عذاب النار﴾ [آل عمران: ١٩٠،١٩١]

නිසැකයෙන්ම. අහස් හා පොළොව නිර්මාණය කිරීමෙහිද, රාත්‍රී හා දහවල් (කාලය) මාරුවී පැමිණීමෙන්ද දැනුම ලද ඥානවන්තයින්ට සාධක ඇත්තේය. ඔවුහු කවරෙකු නම්, සිටගෙන සිටිනවිටද, අසුන්ගෙන සිටිනවිටද, තම ඉල ඇට පෙදෙසෙහි (හාන්සිවී) සිටිනවිටද, අල්ලාහ්ව (ප්‍රශංසාකර) සිහිකර සිටින්නන්ය. තවද, අහස් හා පොළොවෙහි නිර්මාණය පිළිබඳව කල්පනාකර, අප දෙවියනේ, මේ සැම දේ ඔබ නිශ්ප්‍රයෝජනව නිර්මාණය නොකළේය. ඔබ ඉමහත් පවිත්‍රවන්තයාය. (නිරයේ) ගින්නෙහි වේදනාවෙන් අපව ආරක්ෂා කරනු මැනවි'. (යනුවෙන් ප්‍රාර්ථනා කරන්නන්ය)

*(අල්කුර්ආන් - 3:190,191)*

5- ඉස්ලාමය පරිපූරණ ප්‍රතිපත්තීන් හා නීතිරීතීන් අඩංගු ධර්මයෙකි. මෙය මිනිස් සිහි බුද්ධියෙන් ඇති කළ ධර්මයක් නොවන අතර, (පැහැදිළි) සත්‍ය ප්‍රතිපත්තීන්, සූක්ෂම සිරිත් විරිත් හා යහපත් ගුණාංගයන් පරිපූරණයෙන් අඩංගු ධර්මයෙකි. තවද, මෙය තනිවම හා සමූහයෙන් ඉටුකරන කාර්යයන්ද අඩංගු ප්‍රථම හා අවසාන ධර්මයක්ය.

6- ඉස්ලාමය මිනිස් ඥාතිකම සළකන හා කුසල සහ ශීලාචාරය ඉටුකිරීමට පැහැදිළි මාර්ගයෙන් යොමු කරන ධර්මයෙකි.

7- ඉස්ලාමය විරුද්ධවාදියා හෝ මිත්‍රයා හෝ ඥාතියා හෝ ඥාතියා නොවන්නා හෝ වේවා කවරෙකුටත් සාධාරණයක් ඉටුකරන ධර්මයෙකි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿إن الله يأمر بالعدل والإحسان﴾ [النحل:٩٠]

නියත වශයෙන්ම; අල්ලාහ් යුක්තිය (සාධාරණය) ඉටුකරන ලෙසත්, කුසල් කාර්යයන්හි යෙදෙන ලෙසත් අණ කරයි.
(අල්කුර්ආන්-16:90)

﴿وإذا قلتم فاعدلوا ولو كان ذا قربى﴾ [الأنعام:١٥٢]

ඔබලා ප්‍රකාශ කරන විට, එයින් පීඩනයට ලක්වන්නේ ඔබ කිට්ටුම ඥාතීන් වුවත් සාධාරණයම ප්‍රකාශ කරන්න.
(අල්කුර්ආන්-6:152)

﴿ولا يجرمنكم شنآن قوم على ألا تعدلوا هو أقرب للتقوى﴾
[المائدة: ٨]

කිසියම් සමාජයක් කෙරෙහි ඔබලාට පවතින අසතුටුකම සාධාරණය නොකිරීමට ඔබලාව උනන්දු නොකරන්න. සාධාරණය ඉටු කරන්න. තක්වා හෙවත් බියහැතිකමට සමීපව පවතින්නේ හෙතම මෙයමයවේ. (අල්කුර්ආන්-5:8)

8- ඉස්ලාමය යථාර්ත සහෝදරත්වයෙන් යුත් ධර්මයක් බැවින් මුස්ලිම්වරුන් සැම දෙනා සහෝදරයින්ය. ඉස්ලාමයෙහි රට, ජාති හා වර්ණ භේදයද, විවිධ වර්ග වාදයද, ජාති හා වර්ණ භේද භාවයද නොවන්නතේය. ඉස්ලාමයෙහි ශ්‍රේෂ්ඨත්වය පවතින්නේ අල්ලාහ් කෙරෙහි බියහැතිකම අනුවය. මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿إن أكرمكم عند الله أتقاكم﴾ [الحجرات:١٣]

ඔබලා අතර කවරෙකු ඉතාමත් බියභක්තිකයා ලෙස සිටින්නේද, නිසැකයෙන්ම, අල්ලාහ් වෙත ඉතා ගෞරනීය වන්නයා හෙතම ඔහුමය. (අල්කුර්ආන්-49:13)

9- ඉස්ලාමය විද්‍යාත්මක ධර්මයක් බැවින්, ඒ අනුව කල්පනා කොට එය අනුගමනය කරන ලෙස අණ කරන අතර, එසේ අනුගමනය කරන්නන්ට ඉස්ලාමය ඉමහත් කුලියද පිළියෙල කර ඇත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿يرفع الله الذين آمنوا منكم والذين أوتوا العلم درجات﴾ [المجادلة: ١١]

ඔබලා අතර සිටින විශ්වාස වන්තයින්ට හා දැනුම් ඥාන වන්තයින්ට අල්ලාහ් තරාතිරම උසස් කරයි. *(අල්කුර්ආන්-58:11)*

﴿قل هل يستوى الذين يعلمون والذين لايعلمون﴾ [الزمر:٩]

(නබිතුමනි) ඔබ පවසන්න. දැනුම් ඥානය ලද අයත් දැනුම් ඥානය නොලද අයත් සමාන වන්නෙහිද ?
*(අල්කුර්ආන්-39:9)*

නබි මුහම්මද් (සල්) තුමා මෙසේ පවසන්නේය.

[طلب العلم فريضة على كل مسلم] (المعجم الصغير)

අධ්‍යාපන දැනුම ලබා ගැනීම සෑම මුස්ලිම්වරයෙකුටම අනිවාර්යවේ, *(අල්මු:ජමුස් සගීර් ග්‍රන්ථය ඇසුරෙනි)*

10-කවර පුද්ගලයක් හෝ සමාජයක් හෝ වේවා ඉස්ලාම් ධර්මය පිළිගෙන එහි කරුණු නිසියාකාරව අනුගමනය කරන්නේනම්, අල්ලාහ් ඔහුට හෝ එම සමාජයට ර්‍ෂකවරනය හා සෞභාග්‍යය ලබා දෙන්නේය. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وعد الله الذين آمنوا منكم وعملوا الصالحات ليستخلفنهم فى الأرض كمااستخلف الذين من قبلهم ، وليمكنن لهم دينهم الذى ارتضى لهم وليبدلنهم من بعد خوفهم أمنا، يعبدوننى لاتشركون بى شيئا﴾ [النور:٥٥]

ඔබලාගෙන් කවරෙකු හෝ විශ්වාසකර යහපත් කාර්යයන්හි යෙදී සිටින්නේද, ඔවුන්ට පෙර විසූවන් (පොලොවට) පාලක යන් ලෙස පත්කළ සේම, නිසැකයෙන්ම, ඔවුන්වද පොළො වට පාලකයින් ලෙස පත්කරන බවත්, ඔහු ඔවුන් වෙනුවෙන් පිළිගෙන තෘප්තිවූ ධර්මයෙහි ඔවුන්ව නිසැකයෙන්ම ස්ථිර කරන බවත්, නිසැකයෙන්ම, ඔවුන් (සිත්) තුලෙහි ඇති බිය සැනසුම මගින් වෙනස් කරන බවත්, අල්ලාහ් පොරොන්දුවී සිටී. ඔවුහු මා සමග (කිසිඳු දෙයක් හෝ කිසියම් කෙනෙක්) ආදේශ නොකර, මාහට (පමණක්) වන්දනාමානය කරති. *(අල්කුර්ආන්-24:55)*

﴿من عمل صالحا من ذكر أو أنثى وهو مؤمن فلنحيينه حياة طيبة ، ولنجزينهم أجرهم بأحسن ماكانوا يعملو ن﴾ [النحل:٩٩]

පිරිමියෙකු හෝ ස්ත්‍රියෙකු හෝ වේවා කවරෙකු විශ්වාසියෙකු ලෙස සිට, (යහපත් දහමට අදාල) කාර්යයන්හි යෙදී සිටියේ නම්, අපි ඔවුන්ව (මෙලොවෙහි) සෞදර්යමත් පිරිසිදු ජීවිත යක් ගත කරන්නට සලස්වන්නෙමු. තවද, (පරලොවෙහි) ඔවුන්ට ඔවුන් කළ කාර්යයන් (කෙරෙහි) ලස්සන කුලියක් නිසැකයෙන්ම, ලබා දෙන්නෙමු. *(අල්කුර්ආන්-16:97)*

11-ඉස්ලාමය ප්‍රියභාවය, සමගිකම, සහජීවනය හා මෛත්‍රීභාව යෙන් යුත් ධර්මයෙකි. මුහම්මදු (සල්) තුමා මෙසේ පවසයි.

[مثل المؤمنين في توادهم ، وتراحمهم ، وتعاطفهم كمثل الجسد إذا اشتكى منه عضو تداعى له سائر الجسد بالحمى والسهر](رواه مسلم)

විශ්වාස වන්තයින් අතර එකිනෙකුට පරස්පර ආදරය, කරුණාව හා මෛත්‍රිය දැක්වීමෙහි උදාහරණය මිනිසෙකුගේ ශරීරය සේය. ශරීරයෙහි එක් අවයක් ලෙඩකට ලක්වන්නේනම්,

මුළු ශරීරයම උණෙන් හා අවදියෙන් එකී වේදනාව අනුභව කරන්නේය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

[الراحمون يرحمهم الرحمن ، ارحموا من في الأرض يرحمكم من في السماء] (رواه الترمذي)

කරුණා වන්තයාවූ රහ්මාන් (අල්ලාහ්) කරුණා වන්තයින්ට කරුණාව දක්වයි. පොළොවෙහි සිටින්නන්ට කරුණාව දක් වන්න. අහසෙහි සිටින්නා ඔබලාට කරුණාව දක්වයි. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

[لا يؤمن أحدكم حتى يحب لأخيه ما يحب لنفسه] (رواه البخاري)

ඔබලාගෙන් කවරෙකු තමා කැමතිවන දේ කෙරෙහි තම සහෝදරයාටද කැමති නොවන්නේද, ඔහු (පරිපූරණ) විශ් වාස වන්තයා නොවන්නාය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

12-ඉස්ලාම් ධර්මය ස්ථිරතාවයෙන්, උනන්දුවෙන් හා ක්‍රියාවෙන් යෙදෙන ධර්මයෙකි. මුහම්මද් (සල්) තුමා මෙසේ පවසයි.

[المؤمن القوي خير وأحب إلي الله من المؤمن الضعيف وفي كل خير احرص على ما ينفعك واستعن بالله ولا تعجز، وإن أصابك شيء فلا تقل لو أني فعلت كان كذاوكذا ولكن قل قدر الله وما شاء فعل فإن لو تفتح عمل الشيطان ] (رواه مسلم)

ශක්තිමත් විශ්වාස වන්තයා අසරණ විශ්වාස වන්තයාට වඩා අල්ලාහ් වෙත ශ්‍රේෂ්ඨ හා ප්‍රිය වන්තයාය. සෑම දේහි යහපත ඇත්තේය. ඔබට ප්‍රයෝජනය දෙන දෙය කෙරෙහි උනන්දු වෙන්න. අල්ලාහ්ගෙන් ආරක්ෂාවරණය පතන්න. නොහැකි භාව යෙන් නොසිටින්න. කිසියම් දෙයක් ඔබට සිදුවූවිට 'මා මෙසේ කළේනම්, මෙසේ පවතී' යනුවෙන් නොපවසන්න. එනමුත්,

'අල්ලාහ්ගේ පැවැත්ම හා ඔහුගේ කැමැත්ත පරිදි සිදුවූ' බව පවසන්න. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

13-ඉස්ලාමය එකිනෙකට පරස්පර විරුද්ධතාවයක් නොවන ධර්මයෙකි. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿ولو كان من عند غير الله لوجدوا فيه اختلافا كثيرا﴾ [النساء:٨٢]

(මෙය) අල්ලාහ් නොමැති වෙනත් කෙනෙකුගෙන් ලැබී තිබේ නම්, මෙහි පරස්පර විරෝධතා රාශියක් ඔවුහු දකිති. *(අල්කුර්ආන්-4:82)*

14-ඉස්ලාමය පැහැදිළි, සැම දෙනාටම පහසුවෙන් වටහා ගැනීමට හැකි ධර්මයකි.

15-ඉස්ලාමය දැනගැනීමට හා එහි පිවිසීමට අදහස් කරන්නාට කිසියම් විටක හෝ නොවැසූ විවෘත ධර්මයකි.

16-ඉස්ලාමය යහපත් ගුණධර්මයන් හා ක්‍රියාවන් කරා කැඳවන්නේය. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿خذ العفو وأمر بالعرف وأعرض عن الجاهلين﴾ [الأعراف:١٩٩]

එබැවින්, (නබිතුමනි) සමාව අයැදීමෙහි යෙදෙන්න. කුසල් ක්‍රියාවන්හි යෙදෙන ලෙස (මිනිසුන්ට) අණ කරන්න. තවද දැනුම් ඥානය නොලද මෝඩයන් නොසළකා ප්‍රතික්ශේප කරන්න. *(අල්කුර්ආන්-7:199)*

﴿ادفع بالتي هي أحسن فإذا الذى بينك وبينه عداوة كأنه ولي حميم﴾

[حم سجدة : ٣٤]

ඔබලා (අකුසල) කුසල මගින්ම අවලංගු කරන්න. එවිට කව රෙකු හා ඔබ අතරෙහි විරුද්ධකම පවතින්නේද, ඔහු කිට්ටුම මිත්‍රයෙකු ලෙසට පත්වේ. *(අල්කුර්ආන්-41:34)*

නබි මුහම්මද් (සල්) තුමා මෙසේ පවසන්නේය.

[أكثر ما يدخل الناس الجنة تقوى الله وحسن الخلق] (رواه سنن ابن ماجة)

ස්වර්ගයෙහි අධික මිනිසුන් පිවිසීමට හේතුවන්නේ, අල්ලාහ් කෙරෙහි බියහැතිකම හා යහපත් ගුණධර්මයවේ.
*(සුනන් ඉබ්නු මාජා ග්‍රන්ථය ඇසුරෙනි)*

[أكمل الناس إيمانا أحسنهم خلقا] (رواه أبو داود)

මිනිසුන් අතර විශ්වාසභාවයෙන් පරිපූරණ වන්නයා යහපත් ගුණාංග ශීලයාය. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

[ أحب الناس إلى الله أنفعهم للناس ، وأحب الأعمال إلى الله سرور تدخله على مسلم ، أو تكشف عنه كربة ، أو تقضي عنه دينا ، أو تطرد عنه جوعا ، ولأن أمشي مع أخ لي في حاجة أحب إلي من أن أعتكف في هذا المسجد شهرا] (المعجم الصغير)

මිනිසුන්ගෙන් අල්ලාහ්ට ඉතාමත් ප්‍රිය වන්නයා මිනිසුන්ට ප්‍රයෝජනය වන්නාය. ක්‍රියාවන්හි අල්ලාහ්ට ඉමහත් ප්‍රිය ක්‍රියාව, මුස්ලිම්වරයෙකු ප්‍රීතියට පත්කිරීම හෝ ඔහුගේ කර දරයක් ඉවත් කිරීම හෝ ඔහුගේ ණයක් පියවීම හෝ ඔහුගේ කුස ගින්න නිම කිරීමකි. මා මාගේ සහෝදරයෙකුගේ අව ශ්‍යතාවයක් ඉටු කිරීම සඳහා ඔහු සමග ගමන් කිරීම මෙම දේවස්ථානයෙහි මාසයක් (අල්ලාහ් වෙනුවෙන්) රැඳී සිටීමට වඩා මාහට ඉමහත් ප්‍රිය ක්‍රියාවකි. *(ග්‍රන්ථය : මු:ජමුස් සගීර්)*

17-ඉස්ලාමය මිනිස් බුද්ධිය ආරක්‍ෂා කරයි. එහෙයින්, රා, මද්‍ය පානයන්, සිහි බුද්ධිය අහිමි කරන ද්‍රව්‍යයන් හා මිනිස් ඝාත නය තහනම් කරයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ولاتقتلوا أنفسكم إن الله كان بكم رحيما﴾ [النساء:٢٩]

ඔබලා ඔබලාම ඝාතනය නොකරන්න. නිශ්චය වශයෙන්ම, අල්ලාහ් ඔබලා සමග ඉමහත් ආදර වන්තයා ලෙස සිටී.

*(අල්කුර්ආන්-4:29)*

18-ඉස්ලාමය මිනිසුන්ගේ සම්පත් ආරක්ෂා කරන බැවින්, තමන් වෙත ආරක්ෂාව සඳහා භාර කරන ලද සම්පත් ආරක්ෂා කළ යුතු බව උනන්දු කරයි. තවද, ඉස්ලාමය මෙවැන්නන් ප්‍රශංසා කරන අතර, ඔවුන්ට යහපත් ජීවිතයක් හා ස්වර්ගයෙහි පිවිසීමේ භාග්‍යයක් තිබෙන බවට පොරොන්දුවක්ද ලබා දෙයි. ඉස්ලාමය සොරකම තහනම් කරන අතර, සොරකමෙහි යෙදී සිටින්නාට මෙලොවෙහි හා පරලොවෙහි දඬුවම නියම කර ඇති බවද අවවාද කරයි. එනිසා කෙනෙකු කිසියම් සම්පතක් සොරකම් කිරීමට හා මිනිසුන් බිය ගැන්වීමට උනන්දුව නොදක්වයි.

19-ඉස්ලාමය මිනිස් ජීවිතය ගරුකර ආරක්ෂා කරයි. එහෙයින්, ඝාතනය කිරීම තහනම්කර, ඝාතකයාට දඬුවම ඝාතනය බව පවසන අතර, ඔහු පරලොව දින නරකාදියෙහි ස්ථිරව සිටිය යුතු බවද අවවාද කරයි. මෙම හේතුන් නිසා මෙම නීතිරීතීන් අනුගමනය කරන මුස්ලිම් රටවල ඝාතනය කිරීම් අඩුවී ඇති බව පෙනේ.

20-ඉස්ලාමය නීරෝගිභාවය ආරක්ෂා කරයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وكلوا واشربوا ولا تسرفوا﴾ [الأعراف: ٣١]

තවද, අනුභව කරන්න. පානය කරන්න. එනමුත්, නාස්ති නොකරන්න. *(අල්කුර්ආන්-7:31)*

මෙම වදන පිළිබඳ අදහස් දක්වන විද්වතුන් මෙම වදනෙහි ආරෝග්‍යභාවයට අයත් නිවාරනයන් සියල්ල අඩංගුවී ඇති බව පවසති. ආහාර පානයන් අනුභව කිරීමේදී සීමාවක් අනු

ගමනය කිරීම නීරෝගීභාවය ආරක්ෂා කරන ශ්‍රේෂ්ඨ හේතු වකි. මෙසේම, රා, මද්‍යපාන යනාදී තහනම් කිරීම මගින්ද ඉස්ලාමය ආරෝග්‍ය භාවය ආරක්ෂා කරයි. මේවාහි ශරීරයේ නිරෝගීභාවයට ඇති හානිය ප්‍රසිද්ධයෙකි. එසේම ගණිකා වෘර්තියෙහි හා සම ලිංගික ආශ්වාදයෙහි යෙදීමද ඉස්ලාමය තහනම් කරයි. මක්නිසාදයත්, මෙමගින් ගුණෝරියා, සිබ්ලිස්, හැර්බිස්, ඒඩ්ස් හා මෙවන් ලෙඩ රෝග සිදුවීම යනාදි ශරී රයේ නිරෝගීභාවයට හානි සිදු කරන බාධකයින් ඇතිවීමද නොසැලකූ කරුණකි.

21 - ඉස්ලාමය නිදහස සීමා කරයි. ඉස්ලාමයෙහි විකිණීම, මිළදී ගැනීම, වෙළඳාම් කිරීම, ගමන් බිමන් කිරීම යනාදියෙහි මිනිසා නිදහස් වන්නේය. නමුත්, මෙම නිදහස වංචා කිරීම, රැවටීම හා කළහ ඇති කිරීම වැනි අල්ලාහ්ගේ සීමාවන් ඉක් මවා නොයන තෙක්ය.

ඉස්ලාමයෙහි, මිනිසා ආහාරයන් හෝ පානයන් හෝ සුවඳ විළවුන් හෝ ඇඳුම් පැළඳුම් හෝ මගින් මෙලෝ මිහිරි ජීවි තය භුක්ති විඳීමට නිදහස් වන්නේය. නමුත්, මෙම නිදහස, ඔහුට හෝ වෙනත් කෙනෙකුට හෝ කිසිදු බාධාවන් ඇති කරන තහනම් කාර්යයන් සිදු නොකර සිටින තෙක්ය.

# ඉස්ලාම් ධර්මයෙහි විශේෂභාවය

මෙලොවෙහි මිනිසාට අවශ්‍යවන හා මෙලොවෙහිද පරලො වෙහිද ඔහුගේ භාග්‍යයට උපකාරවන සෑම දේ ඉගැන්වීම සඳහා ඉස්ලාමය පහළ විය. ඉස්ලාමයෙහි අණ කිරීම් හා වළක්වාලීම් කෙරෙහි අවධානය යොමුකළ විට පැහැදිළිවන ඉස්ලාමයෙහි විශේෂයන් පහත සඳහන්වේ.

# ඉස්ලාමය අණකරන කරුණු

1-ඉස්ලාමය මිනිසා සිව්පාවන්ට සමාන නොවන හා තම මනෝ ආශාවට කීකරු නොවන ශ්‍රේෂ්ඨමත් තරාතිරමට පත්කරන කරුණු කෙරෙහි අණ කරයි. එසේම, මිනිසා තමාට වඩා අනෙකුත් නිර්මාණයන් ශ්‍රේෂ්ඨ නොකරන හා තම දෙවියා නොවන්නාට වන්දනාමානයන් නොකරන උසස් ස්ථානයකට පත් කරන කරුණු කෙරෙහිද අණ කරයි.

2-ඉස්ලාමය මොළය හා අංගයන් කුමක් සඳහා නිර්මාණය කර ඇත්තේද, ඒ අනුව මෙලෝ හා පරලොවට පලදායික කාර්ය යන්හි ප්‍රායෝගිකව යෙදෙන ලෙස අණ කරයි.

3-ඉස්ලාමය, අල්ලාහ්ට පමණක් යනු පිරිසිදු චේතනාවෙන් වන් දනාමානය කරන ලෙස අණ කරන අතර, අල්ලාහ් හැර අන් කිසිවෙකුට හෝ කිසියම් දෙයකට හෝ වන්දනාමානය කිරීම වළක්වයි.

4-ඉස්ලාමය මිනිසුන්ගේ අවශ්‍යතා ඉටුකරන ලෙසත්, ඔවුන්ට උපකාර කරන ලෙසත් අණ කරයි.

5-ඉස්ලාමය, රෝගීන්ගේ ලෙඩ දුක් විමසන ලෙසද, මළවුවන්ගේ අවසන් කටයුතුවල යෙදෙන ලෙසද, මුස්ලිම්වරුන්ට ප්‍රාර්ථනා කරන ලෙසද අණ කරයි.

6-ඉස්ලාමය, යුක්තිය හා සාධාරණය ඉටුකරන ලෙසද, අපරාධ නොකරන ලෙසද, තමා කැමතිවන දේම තම සහෝදරයාට කැමතිවන ලෙසද අණ කරයි.

7-ඉස්ලාමය, ආහාරය සොයා ගැනීමට වෙහෙස දරණ ලෙසද, නින්දිත හා සිඟා කෑමෙන් ඉවත්වී මිනිසා තම ආත්ම ගරුත් වය රැක ගන්නා ලෙසද අණ කරයි.

8- ඉස්ලාමය, සෑම මැවිල්ලයන්ට කරුණාව හා ආදරය දක්වන ලෙසද, ඔවුන්ට යහපත් භාවයෙන් රැකවරණය ලබා දෙන

ලෙසද, ඔවුන්ට ඵල දෙන කාර්යයන්හි වෙහෙස දරණ ලෙසද, ඔවුන්ට හානිය සිදුවන දේ වළක්වන ලෙසද අණ කරයි.

9- ඉස්ලාමය, දෙමාපියන්හට උපකාර කරන ලෙසද, පවුල් ඥාතීන් සමග එක්ව ජීවත් වන ලෙසද, අසල් වැසියන් ගරු කරන ලෙසද, සිව්පාවන්ට කරුණාව දැක්වන ලෙසද අණ කරයි.

10-ඉස්ලාමය, සෑම දෙනාටම අයත් අයිතිවාසිකම ලබා දෙන ලෙසද, තම බිරිඳ හා දරුවන් සමග යහපත් භාවයෙන් හැසිරෙන ලෙසද අණ කරයි.

11-ඉස්ලාමය ආරක්ෂාව සඳහා භාර දෙන සම්පත් රැක ගන්නා ලෙසද, පොරොන්දු ඉටුකරන ලෙසද, අන් අය ගැන යහපත් සිතුවිල්ල ඇති කරන ලෙසද, ක්‍රියාවන්හි කල්පනා කාරීව කටයුතු කරන ලෙසද, යහපත් ක්‍රියාවන්හි සීඝ්‍රවන ලෙසද අණ කරයි.

මෙවන් යහපත් කාර්යයන් රාශියක් පිළිබඳව ඉස්ලාමය අණ කර ඇත.

# ඉස්ලාමය තහනම් කරන කරුණු

මුස්ලිම් වරයා පාප ක්‍රියාවන්හි ගිල්වීමෙන් ඈත්වීම හා නිත් දිත ක්‍රියාවන්හි ගිල්වීමෙන් ඔහු ලබන අවසාන (මරණය) තීරණය පිළිබඳව දැනුම් දෙන තහනම් කරුණු ඉදිරිපත් කිරීම ඉස්ලාමයෙහි විශේෂ භාවයෙකි. මෙමගින් සෑම දෙනා සමාජයෙහි ආරක්ෂා භාවයෙන් ජීවත් වීමට හැක. මෙසේ ඉස්ලාමය වළක්වන කරුණු මෙසේය.

1- තමා නිර්මාණය කළ අල්ලාහ් දෙවියාව ප්‍රතික්ශේප කිරීම හා ඔහුට යමක් ආදේශ කිරීම තහනම් කරයි.

2- අහංකාර කිරීම, ආඩම්බරවීම, ඊර්ෂ්‍යා කිරීම හා පීඩනයට ලක්වූ තැනැත්තා ගැන ප්‍රියවීම තහනම් කරයි.

3- නපුරු සිතුවිල්ල, නිමිත්ත බැලීම, අල්ලාහ්ගේ දායාදයන් ගැන අනපේක්ෂා කිරීම ලෝභකම හා නාස්තිය තහනම් කරයි.
4- කම්මැළිකම, බිය ගුල්වීම, අසරණකම, රැකියා විරහිතකම, ශීඝ්‍රවීම, අප්‍රසන්නවීම, ලැජ්ජා නොවීම, අඥානා බස් කීම, නොහැකිභාවය, කෝපවීම, අක්‍රමිකතාවය හා තමාට දෙයක් නොලැබීම ගැන ඉවසා නොසිටීම තහනම් කරයි.
5- හිතුවක්කාර කම, අවශ්‍යවුවන්ට හා අසරණයන්ට උපකාර කිරීම වළක්වන තද සිතෙන් සිටීම තහනම් කරයි.
6- කේළාම් (මිනිසුන් අප්‍රියවන දේ) කීම හා ප්‍රශ්න ඇති කිරීමේ අරමුණින් මිනිසුන් අතර දොස්පද පතුරුවීම තහනම් කරයි.
7- පලක් නොමැති අධික කතාබහවල යෙදීම, රහස්‍ය පතුරුවීම, මිනිසුන්ට හූනියම් කිරීම හා අන් අය අගෞරව කිරීම තහනම් කරයි.
8- බැණීම, ශාප කිරීම, දොස් කීම හා නපුරු නම්වලින් කථා කිරීම වළක්වයි.
9- අධිකව විවාද කිරීම, තර්ක කිරීම හා පාප ක්‍රියාවට යොමු කරන විහිලුවල යෙදීම තහනම් කරයි.
10- සාක්ෂිය වසංකිරීම, අසත්‍ය සාක්ෂි දැරීම, පතිවෘත්ත ස්ත්‍රීන්ට දොස්පද කීම, මළවුවන්ට බැණීම හා දැනුම් ඥානය වසන් කිරීම තහනම් කරයි.
11- මෝඩකම, අකුසල, පිංකළ දානය ගැන ප්‍රසිද්ධ කිරීම හා තමාට කළ උපකාරයක් වෙනුවෙන් තුති පුද නොකිරීම තහනම් කරයි.
12- වංචා කිරීම, ද්‍රෝහිකම් කිරීම හා පොරොන්දුව කඩ කිරීම තහනම් කරයි.
13- දෙමාපියන්ට අපරාධ කිරීම, පවුල් ඥාතිත්වය කඩ කිරීම හා දරුවන් නොසළකා හැරීම තහනම් කරයි.

14-මත්තු බෑලීම හා මිනිසුන්ගේ ඌණතාවයන් ප්‍රසිද්ධ කිරීම තහනම් කරයි.

15-පිරිමින් ස්ත්‍රීන් සේද, ස්ත්‍රීන් පිරිමින් සේද හැසිරීම තහනම් කරයි.

16-මත්පැන් පානය කිරීම, මද්‍යපාන ද්‍රව්‍යයන් භාවිතා කිරීම හා මුදල් නාස්තිය සිදු කරන හූදුවල යෙදීම තහනම් කරයි.

17-ව්‍යාජ ලෙස දිවුරීම මගින් ගැණුම් විකිණීම්වල යෙදීම, මිණුම් කිරුම්වල වංචා කිරීම, තහනම් කාර්යයන්හි මුදල් වියදම් කිරීම හා අසල්වාසීන්ට හිරිහැර කිරීම තහනම් කරයි.

18-සොරකම් කිරීම, කෝපවීම, සමාගමක කොටස් කරුවකු අන් කොටස් කරුවාට වංචා කිරීම හා කම්කරුවාගේ කුලිය ප්‍රමාද කිරීම හෝ කාර්ය අවසන්වීමෙන් පසු කුලිය නොගෑවීම තහනම් කරයි.

19-තමාට හානි සිදුවන තරමට ආහාරපානයන් අධිකව අනුභව කිරීම තහනම් කරයි.

20-එකිනෙකා අප්‍රිය වීම, තරහවීම හා උදාසීනකර පළා යාම තහනම් කරයි. මක්තිසාදයන්, මුස්ලිම්වරයෙකු තම සහෝදරයාව දින තුනකට වඩා අප්‍රියවී සිටීම අවවාද කරයි.

21-ධර්මයේ අනුමත හේතුවෙන් තොරව කෙනෙකුට පහර දීම හා ආයුධයෙන් මිනිසුන් බිය ගැන්වීම තහනම් කරයි.

22-ගණිකා වෘත්තිය, සම ලිංගික ඇසුර හා සාතනය කිරීම තහනම් කරයි.

23-අල්ලස දීම හා අල්ලස ලබා ගැනීම තහනම් කරයි.

24-අපරාධයට ලක්වූ තැනැත්තාට උපකාර කිරීමට ශක්තිය තිබියදී ඔහුව උදාසීන කිරීම තහනම් කරයි.

25-අවසරයෙන් තොරව තමාගේ නොවන නිවසතුළ පිවිසීම හා මිනිසුන් කතා බහක යෙදී සිටින අවස්ථාවේ (ඔවුන්ද එය

අන් අය සවන් දීම අකැමැතිවී සිටින කළ) ඒවා කෙරෙහි සවන්දීමට නැත් කිරීම තහනම් කරයි.

මේවා සියල්ල මුස්ලිම්වරුන් වැළකී සිටින ලෙස ඉස්ලාම් ධර්මය අණ කරන තහනම් කාර්යයන්ය.

# අවසාන දිනය

මිනිසෙකු අවසාන දිනය ගැනද, ඒ හා සම්බන්ධවූ කරුණු ගැනද, එහි සිදුවන කාර්යයන් ගැනද විශ්වාසය කරන තෙක් විශ්වාස වන්තයා නොවිය හැක. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ يوما يجعل الولدان شيبا ﴾ [المزمل:١٧]

එදින, ළදරුවන් (කෙස් පැහුණු) මහල්ලන් කරයි.

*(අල්කුර්ආන් -73:17)*

## අවසාන දිනය පිළිබඳ කරුණු මෙසේය.

## මරණය

මරණය, මේ විශ්වයෙහි ජීවත්වන සෑම ජීවියෙකුගේම අවසානයෙකි. එයින් වැළකී සිටීමට කවරෙකුට හෝ නොහැක. මෙම කරුණ කෙරෙහි අල්ලාහ් මෙලෙස පවසන්නේය.

﴿ كل نفس ذائقة الموت ﴾ [آل عمران :١٨٥]

සෑම ආත්මයක්ම මරණය(ට ලක්වී) භුක්ති විඳිය යුතුයි.

*(අල්කුර්අන් -3:185)*

﴿ كل من عليها فان ﴾ [الرحمن :٢٦]

(පොළොවෙහි) ඇති සියල්ලක්ම විනාශවන්නේය.

*(අල්කුර්අන් -55:26)*

අල්ලාහ් මුහම්මදු (සල්) තුමා අමතා මෙසේ පවසන්නේය.

﴿ إنك ميت وإنهم ميتون ، ثم إنكم يوم القيامة عند ربكم تختصمون ﴾

[الزمر:٣٠]

(නබිතුමනි) නිසැකයෙන්ම, ඔබද මරණයට ලක්වන්නේය. නිසැකයෙන්ම, ඔවුන්ද මරණයට ලක් වන්නෝය. පසුව, නිසැක යෙන්ම, පරලොව දිනයේ ඔබලා ඔබලාගේ දෙවියා වෙත (ගෙන විත්) තර්ක කරති. *(අල්කුර්ආන්-39:31,31)*

මානව සංහතියේ කිසියම් කෙනෙකුට හෝ මෙලොව ස්ථිර ස්ථානයක් නොවන්නේය. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وما جعلنا لبشر من قبلك الخلد﴾ [الأنبياء:٣٤]

(නබිතුමනි) තවද, ඔබට පෙර කිසියම් මිනිසෙකුට ස්ථිර ජීවිතයක් අපි (මෙලොවෙහි) ලබා නොදුන්නෙමු. *(අල්කුර්අන්-21:34)*

1-මරණය, සැක කිරීමට කිසියම් මගක් හෝ නොමැති නිශ්චිත කරුණක්ය. නිසැකයෙන්ම, මරණයට පත්වන්නා තමා සමග මිනීවළය කරා කිසියම් දෙයක් හෝ රැගෙන නොයයි. සැබවින්ම, ඔහු හා සමග ඉතිරිව පවතින්නේ ඔහු කළ ක්‍රියාවන් පමණි.

2- මිනිසාගේ ආයුෂ කාලය අල්ලාහ් හැර අන් කිසිවෙකු හෝ නොදන්නා ගුප්තවූ කරුණෙකි. එබැවින්, කිසිවෙකු තමා කෙදිනද හෝ කවර ස්ථානයෙහිද හෝ මරණයට ලක්වෙන්නේද ? යන කරුණ නොදනී. මක්නිසාදයත්, සැකයෙන්ම, මෙය අල්ලාහ් පමණක් දන්නා සැඟවූ ඥානයෙකි.

3- මරණයට ලක්වනවිට එය බාධාකිරීම හෝ පමා කරවීම හෝ එයින් මගහැර පැන දිවීම හෝ කළ නොහැක.

අල්ලාහ් මෙම කරුණ ගැන මෙසේ පවසන්නේය.

﴿ولكل أمة أجل، فاذا جاء أجلهم لايستأخرون ساعة ولا يستقدمون﴾
[الأعراف:٣٤]

සමාජයේ සැමටම (නිශ්චිත ආයුෂයක්) වාරයක් ඇත. ඔවුන් ගේ වාරය පැමිණෙන විට, එය ප්‍රමාදකළ නොහැක. තවද, ඊට පෙරද (සිදු) නොවන්නේය. *(අල්කුර්ආන්-7:34)*

4- විශ්වාස වන්තයෙකුට මරණය සිදුවනවිට, (එමොහොතේදී) ඔහු වෙත මලකුල් මවුත් (පණ ගන්නා සුරදූත වරයා මිහිරි සුවඳවූ සෞන්දර්ය රූපයෙන් පැමිණේ. ඔහු සමග ස්වර්ගය ගැන සුභාරංචි පතන කරුණාවන්ත සුරදූත වරුන්ද පැමිණෙති. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿إن الذين قالوا ربنا الله ثم استقاموا تتنزل عليهم الملائكة ألا تخافوا ولاتحزنوا وأبشروا بالجنة التي كنتم توعدون﴾ [فصلت : ٣٠]

කවරෙකු අප දෙවියා අල්ලාහ් බව පවසා (එහි) ස්ථිර පැවැත් මෙන් සිටින්නේද, නියතවශයෙන්ම ඔවුන් වෙත මලක්වරුන් පැමිණ 'ඔබලා බිය නොවන්න, කණගාටු නොවන්න, ඔබලාට පොරොන්දුවූ ස්වර්ගය ගැන සතුටුවන්න' යනුවෙන් පවසති. *(අල්කුර්ආන්-41:30)*

නමුත්, ප්‍රතික්ශේප කරන්නෙකුට මරණය සිදුවනවිට, ඔහු වෙත මලකුල් මවුත් (පණ ගන්නා සුර දූත)වරයා දුගඳ ඇඳුම් පැළඳ තද කලු මුහුණුවරකින් බිය ජනිත රූපයෙන් පැමිණේ. ඔහු සමග වේදනාව ගැන සුභාරංචි (අවවාද කරන) පතන (වේදනා ගෙනෙන) මලක්වරුන්ද පැමිණෙති.

අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ولو ترى إذ الظالمون في غمرات الموت والملائكة باسطوا أيديهم، أخرجوا أنفسكم اليوم تجزون عذاب الهون بما كنتم تقولون على الله غير الحق وكنتم عن آياته تستكبرون﴾ [الأنعام :٩٣]

අපරාධකරුවන් මරණ වේදනාවට ලක්ව සිටීම ඔවුහු දකින කළ, මලක්වරුන් තම දෑත් දික්කරමින් 'ඔබලාගේ පණ පිට මංකරන්න, අද දින ඔබලාට නින්දා දෙන වේදනාව කුලිය ලෙස ලැබේ. මන්දයත්, ඔබලා අල්ලාහ් ගැන ව්‍යාජ කරුණු ප්‍රකාශ කරමින්ද, ඔහුගේ වදන් (විශ්වාස නොකර) අහංකාර කරමින්ද සිටියෝය' යනුවෙන් පවසති. *(අල්කුර්ආන්-6:93)*

එනිසා මරණය සිදුවන විට සත්‍ය එළිවෙන අතර, මිනිසුන් සැමට කරුණු පැහැදිළිවේ. අල්ලාහ් මේ බව මෙසේ පවසන් නේය.

﴿حتى إذا جاء أحدهم الموت قال رب ارجعون ، لعلي أعمل صالحا فيما تركت كلا إنها كلمة هو قائلها ومن ورائهم برزخ إلى يوم يبعثون﴾

[المؤمنون:١٠٠،٩٩]

ඔවුන්ගෙන් කෙනෙකුට මරණය සිදුවනවිට ඔහු 'මගේ දෙවි යනේ, මා (මෙලොවෙහි) හැර ආ දේයින් කුසල් ක්‍රියා කිරීම සඳහා මාව නැවත (ලොවට) හරවා එවන්න'. යනුවෙන් පව සයි. කරුණු එසේ නොවේ. ඔහු පවසන්නේ (අසත්‍ය) ප්‍රකාශ යයි. නැගිට්ටවන දිනය තෙක් ඔවුන් ඉදිරියේ තිරයක් තිබේ. *(අල්කුර්ආන්-23:99,100)*

එබැවින්, මරණය සිදුවන විට ප්‍රතික්ශේප කරන්නා (කාෆිර්) හා පාප කාරයා කුසල් ක්‍රියා කිරීම සඳහා මෙලොව කරා නැවත ඒම අපේක්ෂා කරයි. නමුත් මෙලොව අතපසුවීමෙන්

පසු කණගාටුවීමෙන් (කිසිදු) පලක් නොවන්නේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ وترى الظالمين لما رأوا العذاب يقولون هل إلى مرد من سبيل﴾

[الشورى:٤٤]

තවද, අපරාධකරුවන් වේදනාව දකිනවිට (මෙයින්) වැළකී සිටීමට මගක් තිබේද ? යනුවෙන් පැවැසීම ඔබ දකී.

*(අල්කුර්ආන්-42:44)*

## කබ්ර් – මිනීවළ

මිනීවළ ගැන නබි මුහම්මද් (සල්) තුමා මෙසේ පවසන්නේය.

[إن العبد إذا وضع في قبره وتولى عنه أصحابه ، جاء ه ملكــــان فيقعدانـــه فيسألانه عن ربه ، ودينه ، ونبيه ، فأما المؤمن فيقـــول: ربـــي الله، وديـــني الإسلام، ونبي محمد –ﷺ– فيقولان له : انظر إلى مقعدك من النار أبدلـــك الله به مقعدا من الجنة، فيراهما جميعا. وأما الكافر أو المنافق فعندما يسـألانه فإنه يقول : هاه، هاه ، لا أدري ، فيقولان له : لادريت ولا تليت ، ويضـــوب بمطارق من حديد ضربة ، فيصيح صيحة يسمعها من يليه إلا الثقلين ويضيـــق عليه قبره، ويريانه مقعده في النار، ويأتيه من حرها وعذابها]

නිසැකයෙන්ම, පුද්ගලයෙකු මිනීවළෙහි තැන්පත්කර, ඔහු ගේ මිත්‍රයන් පිටත්වීමෙන් පසු, එහි මලක් හෙවත් සුර දූතවරුන් දෙන්නෙක් පැමිණ, ඔහුව වාඩිකරවා ඔහුගෙන් 'ඔබගේ දෙවියා කවරෙකුද ?, ඔබගේ ධර්මය කුමක්ද ?, ඔබගේ නබිවරයා කව රෙකුද ?' යනුවෙන් ප්‍රශ්න කරති.

ඔහු විශ්වාස වන්තයෙකු නම්, 'මාගේ දෙවියා අල්ලාහ්ය, මාගේ ධර්මය ඉස්ලාමය, මාගේ නබිවරයා නබි මුහම්මද් (සල්) තුමාය' යනුවෙන් පවසයි. එවිට එම මලක්වරුන් ඔහුව අමතා 'නරකාදියෙහි ඔබේ ආසනය (ස්ථානය) බලන්න. නිශ්චය වශයෙන්ම, අල්ලාහ් ඔබේ ආසනය ස්වර්ගයට මාරු කළා' යනුවෙන් පවසති.

ඔහු කාෆිර් හෙවත් ප්‍රතික්ෂේප කරන්නෙකු හෝ මුනාෆික් හෙවත් අවස්ථා වාදියෙකු නම්, ඔහුගෙන් ප්‍රශ්න කරනවිට ඔහු 'හාහ්...හාහ්... මා නොදනිමි' යනුවෙන් පවසයි. එවිට එම මලක් වරුන් ඔහුව අමතා 'ඔබ දැන ගත්තේද, පිළිපැද්දේද නොමැත' යනුවෙන් පවසති. තවද, ඔහුට යකඩ (තලන ලොකු) මිටියෙන් පහරක් දෙනු ලැබේ. එවිට ඔහු කෑ කෝ ගසයි. ඒ ශබ්දය මිනිස් හා ජින් වර්ගයන් හැර අන් සියලු දෙනාටම ඇසේ. ඔහුගේ මිනී වළ ඔහුව තද කරයි. මලක්වරුන් දෙදෙනා නරකාදියෙහි ඇති ඔහුගේ ආසනය (ස්ථානය) ඔහුට පෙන්වති. නරකාදියෙහි උෂ්ණය හා දඩුවම ඔහු කරා ඒවි.

මිනීවළෙහි දේහයට නැවත පණදීම මෙලෝ මිනිස් නුවණෙන් වටහාගත නොහැකි පරලොව පිළිබඳ කරුණෙකි. මිනිසා දායාදයට සුදුසු විශ්වාස වන්තයා නම්, මිනීවළෙහි ඔහු දායාදයන් අනුභව කරයි. ඔහු වේදනාවට සුදුස්සෙකු නම්, ඔහු මිනීවළෙහි වේදනාවට ලක්වේ. මෙයින් රැකවරණය පතන මෙන් මුහම්මද් (සල්) තුමා මෙසේ පැවැසූහ.

[تعوذوا بالله من عذاب القبر] (أخرجه أبو داود)

මිනීවළෙහි වේදනාව ගැන අල්ලාහ් වෙතින් රැක වරණය පතන්න.

*(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

නිවැරදි බුද්ධිය (ඇත්තෙකු) මෙය (මිනීවළ වේදනාව) ප්‍රතික්ශේප නොකරයි. මක්නිසාදයත්, මිනිසා තම ජීවිතයෙහිද මෙය සමීපව පවතින බව දකී. එනම්, නින්දෙහි පසුවන්නා තමා දැඩි වේදනාවට ලක්වන බව (සිහිනයෙන්) හැඟී කෑකෝ ගසයි, රෑකවරණය පතයි. මරණය හා ජීවිතය අතර විශාල වෙනසක් තිබෙන අතර, ඔහු අසල සිටින්නාට මෙය නොහැඟෙන්නේය. මිනීවළෙහි වේදනාව පණට හා දේහයට (එකට) සිදුවේ.

නබි මුහම්මද් (සල්) තුමා මිනීවළය පිළිබඳව මෙසේ පවසයි.

[القبر أول منازل الآخرة ، فإن نجا منه فما بعده أيسر منه ، وإن لم ينج منه فما بعده أشد منه] (أخرجه الترمذي)

මිනීවළ පරලොවෙහි නවාතැන්වලින් ප්‍රථම තැනකි. මෙයින් කෙනෙකු ජය ලබන්නේනම්, ඔහුට ඉන් පසු සිදුවන සැම දේ මීට වඩා පහසුවෙන් පවතී. මෙයින් කෙනෙකු ජය නොලබන්නේ නම්, ඔහුට ඉන් පසු සිදුවන සැම දේ මෙයට වඩා අපහසුවෙන් පවතී. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

මෙයට මිනීවළ වේදනාව යනුවෙන් නම්කර ඇත්තේ, මිනිසුන් ගෙන් අධික පිරිස් මිනීවළෙහි භූමිදානය කිරීම නිසාය. එසේ නොවන අය එනම්, දියට ගිලී (යටවී) යන්නන්, ගින්නට දැවී යන්නන්, සතුන් හපා විනාශවූවන් හා මෙවැනි අයට ත්‍යාග හෝ වේදනාව ලැබෙන්නේ පරලොවෙහිදීය.

මිනීවළෙහි වේදනාව විවිධ ආකාරයෙන් පවතී. එය යකඩ වැනි (ලොකු) මිටියෙන් පහර දීම, ඔහුගේ මිනීවළය අන්ධකාර යෙන් පිරී තිබීම, නරකාදියේ ඇතිරිල්ලක් ඔහුට දිගහැරීම, නර කාදියේ දොරටුවක් ඔහුට විවෘතවීම, ඔහුගේ අකුසල් (ක්‍රියා) දුගඳ ඇඳුම් පැළඳ පිළිකුල් මුහුණු වරයෙන් යුත් මිනිසෙකුගේ රූපයෙන් මිනීවළෙහි ඔහු හා සමග අසුන් ගැනීම යනාදියවේ.

දාසයා කාෆිර් හෝ මුනාෆික් වරයෙකුනම්, වේදනාව ස්ථිර යෙන් පවතී. දාසයා පාපකාර විශ්වාසියෙකුනම්, එවිට ඔහුගේ පාප ක්‍රියාවන් අනුව වේදනාවද වෙනස්වේ. (පසු) ඔහු එයින් නිදහස්වේ. දාසයා විශ්වාසියෙකු නම්, ඔහු මිනීවළයෙහි දයාව ලබයි. එනම් ඔහුගේ මිනීවළය විශාල කෙරේ. එය ආලෝකයෙන් පිරේ. ස්වර්ගය කරා ඔහුට දොරක් අරිනු ලැබේ. එමගින් ඔහුට සුගන්ධය ලැබේ. ස්වර්ගයේ ඇතිරිල්ලක් ඔහුට දිගහිනු ලැබේ. ඔහුගේ කුසල් ක්‍රියාවන් සෞන්දර්ය මිනිසෙකුගේ රූපයෙන් මිනී වළෙහි ඔහු හා සමග අසුන්ගෙන සිටී.

# අවසාන දිනයෙහි සළකුණු

1- අල්ලාහ් මෙලොව නිර්මාණය කළේ එය ස්ථිරව පැවැතීම සඳහා නොවේ. නමුත්, එයට අවසාන දිනයක් ඇත්තේය. එය විනිශ්චය දෙන දිනයෙකි. මෙය සැකයෙන් තොර සත්‍යයෙකි. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وأن الساعة آتية لاريب فيها﴾ [الحج:٧]

තවද, නියත වශයෙන්ම, පරලොව (වේලාව) පැමිණේ. එයින් කිසිඳු සැකයක් හෝ නොමැත. *(අල්කුර්ආන්-22:7)*

﴿وقال الذين كفروا لا تأتينا الساعة قل بلى وربي لتأتينكم﴾ [سبأ :٣]

තවද, කාෆිර් වරුන්, (විනිශ්චය කරන පරලොවෙහි) වේලාව අපට නොපැමිණේ යනුවෙන් පවසති. (නබිතුමනී,) 'මාගේ දෙවියා මත දිවුරා කියමි. (එසේ නොවේ) නිසැකව, එය ඔබලා වෙත පැමිණේ'. යනුවෙන් ඔබ පවසන්න. *(අල්කුර්ආන්-34:3)*

අවසාන දිනය පිළිබඳ දැනුම, අල්ලාහ් තම ඥානයෙන් හිමි කරගත් සැගවූ කරුණෙකි. ඔහු තම මැවීම්වලින් කිසිවෙකුට හෝ එය පැහැදිලි නොකළේය. අල්ලාහ් මෙසේ පවසයි.

﴿يسألك الناس عن الساعة ، قل إنما علمها عند الله ، وما يدريك لعل الساعة تكون قريبا ﴾ [الأحزاب:٦٣]

(නබිතුමනි, විනිශ්චයට අයත්) එම වේලාව ගැන මිනිසුන් ඔබෙන් අසති. ඒ පිළිබඳ ඥානය අල්ලාහ් සතුව ඇති බව ඔබ පවසන්න. එය ඔබ දන්නෙහිද ? එය සමීපයෙන් පැමිණීමට හැක. *(අල්කුර්ආන්-33:63)*

2-පාපකාර මිනිසුන් සඳහා අවසාන දිනය සිදුවේ. අවසාන දිනය සිදුවීමට පෙර අල්ලාහ් සුවඳ මඳ සුළඟක් එවයි. එම සුළඟ විශ්වාස වන්තයින්ගේ පණ අත්පත් කරයි. අල්ලාහ් මරණය හා මෙලොව අවසන් කිරීම මගින් මැවීම් කෙරෙහි තීරණයක් ගැනීමට අදහස් කරන්නේනම්, එවිට ඔහු සූර් නැමැති නලාව පිඹින ලෙස (අදාල) මලක්වරයාට අණ කරයි. (සූර් යනුවෙන් හැඳින්වන්නේ මහා අණකි) එම නාදය අසන මිනිසුන් මුළා වේ. අල්ලාහ් මෙය මෙලෙස පවසන්නේය.

﴿ونفخ في الصور فصعق من في السموات ومن في الأرض إلا من شاء الله﴾ [الزمر:٦٨]

සූර්හි පිඹිනලද විට අල්ලාහ් කැමැති අය හැර, අහසේහි හා පොළොවෙහි සිටින්නන් සිහිය නැතිව මුළාවෙති. *(අල්කුර්ආන්-39:68)*

මෙය සිකුරාදා දිනයේ සිදුවේ. පසු සියලු මලක්වරුන් මරණයට පත්වෙති. අල්ලාහ් හැර අන් කිසි දෙයක් හෝ ඉතිරිව නොසවති.

3- සියලු මිනිස් ශරීරයන් විනාශයට පත්වේ. 'අජ්බුදනබ්' හැර අන් සියල්ල පොළොව විනාශ කරයි. (අජ්බුදනබ් යනුවෙන් හැඳින්වන්නේ මුලමකි. එය මිනිසාගේ පිට දණ්ඩ අවසානයේ ඇති ඇටකටුවෙකි) නිසැකයෙන්ම වක්තෘ (නබි)වරුන්ගේද

පරිත්‍යාග ශීලීන් (ෂුහදා වරුන්)ගේද දේහයන් පොළොව විනාශ නොකරයි. අල්ලාහ් අහසෙන් ජලය ඉස (විනාශවූ) ශරීරයන් වර්ධනය කරයි. අල්ලාහ් මිනිසුන් නැගිට්ටවීමට අදහස් කරන්නේනම්, ඔහු සූර් පිඹීම භාර ඉස්රාෆීල් මලක් වරයාට පණ පොවීමෙන් පසු එතුමා දෙවැනි වරට සූර් නලාව පිඹියි. එවිට අල්ලාහ් සියලු මැවීම්වලට පණ ලබා දෙයි. මිනිසුන් පාවහන් නොපැළඳ, නිර්වස්ත්‍රයෙන් හා කත්නා (චර්ම ඡේදනය) නොකර අල්ලාහ් ප්‍රථමයෙන් මැවූ සේ ඔවුන් තම මිනීවළෙහි සිට පිටත්වෙති. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ونفخ في الصور فإذاهم من الأجداث إلى ربهم ينسلون﴾ [يس :٥١]

තවද, සූර් පිඹින ලද්දේනම්, ඔවුහු වහාම සමාධිවලින් (මිනීවළෙන්) පිටත්ව තම දෙවියා කරා ශීඝ්‍ර වෙති.

*(අල්කුර්ආන්-36:51)*

පොලොව පැලී එයින් ප්‍රථමයෙන් පිටත්වන්නේ නබි මුහම්මදු (සල්) තුමාය. පසුව මිනිසුන් මහ්ෂර් පිට්යට ගෙනෙනු ලැබේ. එදින ඉර මැවීම්වලට සමීපයෙන් සිටී.

මිනිසුන් මහ්ෂර් පිට්යේ දීර්ඝ කලක් රැඳී සිට ඔවුන් අතර ප්‍රශ්න කිරිම හා තීන්දු කිරීම අපේක්ෂා කරමින් සිටිති. පසුව ඔවුන් අතර තීන්දු කිරීමට අල්ලාහ් අවසරය ලබා දෙයි. පසුව සිරාතය පිහිටේ. (නිරය මත පිහිටා ඇති මෙය කෙස් ගහට වඩා සිනිඳුයි, කඩුවට වඩා තියුණුයි) මිනිසුන් තමතමන්ගේ ක්‍රියාවන් අනුව එය පසුකර යති. ඔවුන් අතර ඇසිපිය ගැසීමේ මොහොතේද, සුළඟ වේගයෙන්ද, අධික වේගයෙන් දුවන අශ්වයන් සේද, බඩ ගැමෙන්ද සිරාතය පසු කර යන අයද සිටිති, සිරාතය මත ඇති දම්වැල් මිනිසුන් අල්ලා නිරයට වීසි කරයි. එවිට කාෆිර්වරු හා අල්ලාහ් කැමැතිවන පාපකාර විශ්වාසීන් නරකාදියට වැටෙති.

නියත වශයෙන්ම කාෆිර්වරුන් නරකාදියේ ස්ථිරව පසුවෙති. පාපකාර විශ්වාස වන්තයින් අල්ලාහ්ගේ මතය පරිදි වේදනා වට ලක්වීමෙන් පසු ස්වර්ගයට පිවිසෙති. සිරාතය පසුකර යන්නන් එනම් ස්වර්ගවාසීන් ස්වර්ගය හා නිරය අතර පිහිටා ඇති පාලමෙහි රැඳී සිටිති. එහි පිරිසක් තවත් පිරිසක්ව පළි ගනිති. යමෙකු තම සහෝදරයෙකුට කළ අපරාධය සඳහා පළිගෙන එමගින් ඔහු තෘප්තිවන තෙක් ස්වර්ගයට පිවිසීමට නොහැක.

ස්වර්ගවාසීන් ස්වර්ගයටද, අපාය වාසීන් අපායටද පිවිසීමෙන් පසු මරණය එළුවෙකුගේ රූපයෙන් ගෙන ස්වර්ගය හා අපාය අතර කපනු ලැබේ. මෙය ස්වර්ගය හා අපාය වාසීන් දුටුමින් සිටිති. පසුව, ස්වර්ගවැසිනි, (ඔබලා) නිරන්තරයෙන් සිටින්න. (ඔබලාට) මරණය නොමැත යනුවෙන්ද, අපායය වැසියනි, (ඔබලා) නිරන්තරයෙන් සිටින්න. (ඔබලාටද) මරණය නොවන් මැත යනුවෙන්ද පැවැසේ. කෙනෙකු ප්‍රීතියෙන් මරණයට පත් වන්නේනම්, ස්වර්ග වැසියා ප්‍රීතියෙන් මරණයට පත්වේ. යමෙකු දුකෙන් මරණයට පත් වන්නේනම්, අපාය වැසියා දුකෙන් මරණයට පත්වේ.

# අපාය හා එහි වේදනා

අපාය හා එහි වේදනා පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿فاتقوا النار التي وقودها الناس والحجارة ، أعدت للكافرين﴾ [البقرة:٢٤]

මිනිසුන් හා ගල් දවන ද්‍රව්‍යවූ නරකාදියේ ගින්න කෙරෙහි බියවන්න. එය (අල්ලාහ් තම ධර්ම ග්‍රන්ථ ප්‍රතික්ශේප කරන) කාෆිර්වරුන්ටම සූදානම්කර ඇත. *(අල්කුර්ආන්-2:24)*

නබි මුහම්මදු (සල්) තුමා තම සහාබා හෙවත් ශ්‍රාවකරුවන් අමතා මෙසේ පැවැසීය.

[ناركم هذه التي توقدون جزء من سبعين جزءا من نار جهنم] قالوا : والله إن كانت لكافية يارسول الله، قال : [فإنها فضلت بتسع وستين جزءا كلها مثل حرها] (رواه البخاري ومسلم)

'ඔබලා දල්වන මෙම ගින්න, ජහන්නම් යන නරකාදියෙහි ගින්නෙන් හැත්තෑවෙන් එක පංගුවෙකි'. යනුවෙන් නබිතුමා පැවසූවිට මවුන් නබිතුමනි, මෙය (වේදනා කිරීමට) ප්‍රමාණවත් වේ යනුවෙන් කීහ. එයට නබිතුමා 'නිසැකයෙන්ම මෙය හැට නවය පංගුවෙන් වැඩිකර ඇත. ඒ සියල්ල මෙවැනි උණුසුම්ය.' යනුවෙන් පැවැසීය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නිරය මහල් ප්‍රසාද හතකින් යුත්තෙකි. සෑම මහලක්ම අන් මහල්වලට වඩා දුෂ්කර වේදනා සහිතකි. එයින් සෑම මහලකම තම තමන්ගේ ක්‍රියාවන් අනුව සුදුස්සන් සිටිති. මුනාෆික්වරුන් පහළම මහලේ සිටිති. මෙය දැඩි වේදනා සහිතකි. කාෆිර්වරුන්ට නරකාදියේ වේදනාව අඛණ්ඩව හා ස්ථිරව පවතී. නමුත්, වේද නාව අධිකව දීම සඳහා මවුන් නරකාදියේ දැවූ සෑම අවස්ථා වෙහිම නැවත පෙර තත්ත්වයට ගෙනෙනු ලැබේ. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

﴿كلما نضجت جلودهم بدلناهم جلودا غيرها ليذوقوا العذاب﴾[النساء:٥٦]

මවුන් වේදනාව (සම්පූර්ණයෙන්) භුක්ති විඳීම සඳහා මවුන් ගේ හම ගැ(ල)වීයනවිට එය නොවන වෙනත් හම් මවුන්ට මාරු කරමින් සිටින්නෙමු. *(අල්කුර්ආන්-4:56)*

﴿والذين كفروا لهم نار جهنم ، لايقضى عليهم فيموتوا ولايخفف عنهم من عذابها ، كذلك نجزى كل كفور﴾ [فاطر:٣٦]

ප්‍රතික්ශේප කරන්නන්ට නරකාදියෙහි ගින්න (සුදානම්කර)

ඇත. ඔවුන් මැරුම් දකින ආකාරයට ඔවුන්ගේ කාර්යයන් අව සන් නොකරේ. තවද, නරකාදියේ ඔවුන්ගේ වේදනාවද පහසු කරනු නොලැබේ. මෙසේම සෑම කාෆිර්වරුන්ටම අපි කුලිය ලබා දෙන්නෙමු. *(අල්කුර්ආන්-35:36)*

ඔවුන් එහි විලංගු කෙරේ. ඔවුන්ගේ බෙල්ලටද විලංගු දැමේ. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නෝය.

﴿وترى المجرمين يومئذ مقرنين في الأصفاد، سرابيلهم من قطران وتغشى وجوههم النار﴾ [إبراهيم :٤٩،٥٠]

තවද. එදින අපරාධකරුවන් දම්වැල්ලෙන් බැඳ සිටීම ඔබ දකී. ඔවුන්ගේ ඇඳුම් තාරවලින් සාදා තිබේ. තවද, ඔවුන්ගේ මුහුණු ගින්නෙන් දවනු ලැබේ. *(අල්කුර්ආන්-14:49,50)*

නරකාදී වැසියන්ගේ ආහාරය ජක්කුම් ගසකි. අල්ලාහ් හා නබි මුහම්මද් (සල්) තුමා මේ බව මෙසේ පවසන්නෝය.

﴿إن شجرت الزقوم طعام الأثيم ، كالمهل يغلى في البطون كغلى الحميم﴾ [الدخان :٤٣،٤٤]

නිසැකයෙන්ම, ජක්කුම් ගස පාපකාරයන්ගේ ආහාරයෙකි. එය උණුකරනලද තඹ සේ පවතී. කුසෙහි එය උණුවූ ජලය සේ උණුවේ. *(අල්කුර්ආන්-44:43,44)*

[لو أن قطرة من الزقوم قطرت في دار الدنيا لأفسدت على أهل الدنيا معايشهم فكيف بمن يكون طعامه ؟] (سنن الترمذي)

ජක්කුම් ගසෙන් බිංදුවක් හෝ ලොවෙහි වැටෙන්නේනම්. ලොව වැසියන්ගේ ජීවිතය විනාශවේ. එසේනම්, එය ආහාරය වූවන්ගේ තත්ත්වය කෙසේ පවතීද ? *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

නරකාදියෙහි අසීරු වේදනාවන් හා ස්වර්ගයෙහි භාග්‍යයේ විශේෂත්වයන් පිළිබඳව නබිතුමාගේ වදනක් මෙලෙස අනාවරණය කරයි.

[يؤتى بأنعم أهل الدنيا من الكفار في النارغمسة ثم يقال له :هل مر بك نعيم قط ؟ فيقول : لا، ما مر بي نعيم قط. نسي كل نعيم الدنيا وترفها من غمسة واحدة في النار،كذلك يؤتى بأبأس أهل الدنيا من المؤمنين فيغمس في الجنة غمسة، ثم يقال له: هل مر بك بؤس قط ؟ فيقول : لا، ما مر بي بؤس قط ولا أذى. نسي كل ما قاساه في الدنيا من البؤس والفقر والشقاء من غمسة واحدة في الجنة] (رواه مسلم)

මෙලොවෙහි සියලුම භාග්‍යයෙන් ජීවත්වූ කාෆිර් වරයෙකු ගෙනෙනු ලැබේ. ඔහු අපායයෙ (ගින්නෙ)හි වරක් ගිල්වනු ලැබී මෙන් පසු ඔහුගෙන් 'ඔබට (ලොවෙහි) කිසියම් භාග්‍යයන් තිබුණේද?' යනුවෙන් විමසේ. මාහට කිසියම් භාග්‍යයන් හෝ නොතිබුණු බව ඔහු පවසයි. අපායයෙහි වරක් ගිල්වීමෙන් ඔහුට ලොවෙහි භාග්‍යයන් සියල්ල අමතකවිය.

එසේම ලොවෙහි ඉතාමත් අසීරුතාවයට ලක්වූ විශ්වාස වන්ත යෙකු ගෙනෙනු ලැබේ. ඔහු වරක් ස්වර්ගයෙහි ගිල්වීමෙන් පසු ඔහුගෙන් 'ලොවෙහි ඔබට කිසියම් අසීරුතා පවතීද ? යනුවෙන් විමසේ. මාහට කිසිඳු අසීරුතා හෝ දුෂ්කරතා නොතිබුණු බව පවසයි. ස්වර්ගයෙහි වරක් ගිල්වීමෙන් ඔහුට ලොවෙහි සිදුවූ අසරණකම, දිළිඳුකම හා අභාග්‍යයන් අමතකවිය.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

# ස්වර්ගයෙහි ස්වභාවය

ස්වර්ගය අල්ලාහ්ගේ යහපත් ශීලීන්ගේ කීර්තිමත් ස්ථිර නිව සකි. එහි කිසිඳු ඇසක් නුදුටු, කිසිඳු කනක් නොඇසූ හා කිසි යම් මිනිස් සිත් සතන්තුල වර්ණනා නොවූ භාග්‍යයන් තිබේ. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿فلا تعلم نفس ما أخفي لهم من قرة أعين ، جزآء بما كانوا يعملون﴾

[السجدة :١٧]

ඔවුන් කළ (යහපත්) ක්‍රියාවන් සඳහා ත්‍යාග ලෙස (ලබාදීමට) සඟවා ඇති නෙත් පිනවීම (පරලොව මෝක්ෂය) කිසියම් පුද්ගල යෙකු හෝ නොදනී. *(අල්කුර්ආන්-32:17)*

ස්වර්ගයෙහි ස්වභාවය මු:මින්වරුන්ගේ ක්‍රියාවන් අනුව උස් පහත්ව පවතී. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ يرفع الله الذين آمنوا منكم والذين أوتوا العلم درجات﴾ [المجادلة : ١١]

ඔබලා අතර සිටින විශ්වාසීන්ගේද, දැනුම් ඥානය ලත් විද් වතුන්ගේද තරාතිරම අල්ලාහ් උසස් කරයි. *(අල්කුර්ආන්-58:11)*

ස්වර්ගවාසීන් තමාගේ සිතට ඇල්මවන දේ එහි අනුභව හා පානය කරති. එහි පාට වෙනස් නොවන ගංගාවන්ද, රස වෙනස් නොවන කිරි ගංගාවන්ද, පිරිසිදු මී පැනි ගංගාවන්ද, පානය කරන්නන්ට තෘප්තිය ගෙනදෙන මද්‍ය පාන ගංගාවන්ද ඇත. එම මද්‍ය පානය මෙලොවෙහි මද්‍ය පානයන් සේ නොවන්නේය. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

﴿يطاف عليهم بكأس من معين ، بيضآء لذة للشاربين ، لا فيها غول ولاهم عنها ينزفون ﴾ [الصافات:٤٥-٤٧]

පිරිසිදු පානයෙන් පිරී භාජන මවුහු වටකරගෙන ඒවි. (එය) තද සුදය. පානය කරන්නන්ට මිහිරි රසය. එයින් (කිසියම්) බාධාවක් නොමැත. තවද, මෙයින් මවුහු බුද්ධි නොසන්සුන්තා වයට පසු නොවන්නෝය. *(අල්කුර්ආන්-37:45-47)*

එහි 'හූරුල් ඊන්' කන්‍යාවන් විවාහකර දෙනු ලැබේ.

නබි මුහම්මදු (සල්) තුමා මෙම කරුණ පිළිබඳව මෙසේ පව සන්නේය.

[لو أن إمرأة من أهل الجنة إطلعت على أهل الأرض لأ ضاءت ما بينهما - أي السماء والأرض - ولملأته ريحا] (رواه البخاري)

ස්වර්ගයෙහි කන්‍යාවන් කෙනෙක් ලොව වැසියන් කරා පැමි ණෙන්නේනම්, ඇය අහස හා පොලොව අතර ඇති දේ ආලෝක මත් කර, සුගන්ධයෙන් පුරවයි. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

ස්වර්ග වැසියන්ගේ ඉමහත් භාග්‍ය වන්නේ අල්ලාහ්ව බැහ දැකීමකි. තවද, මවුන් එහි මලමූත්‍රා පහකිරීම, නාහය සීරීම හා කෙළ ගැසීම නොකරති. මවුන්ගේ පනාව රත්රන්ය. මවුන්ගේ දහඩිය කස්තුරියකි. මේවා ඌනවීමක් හෝ විසන්ධිවීමක් හෝ නොවන ස්ථිර භාග්‍යයන්ය.

නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[من يدخل الجنة ينعم ولاييأس ولايبلى ونصيب أقل أهل الجنة خير من الدنيا كلها عشر مرات]

කවරෙකු ස්වර්ගයට පිවිසෙන්නේද, ඔහුට භාග්‍යයන් ලැබේ. ඔහුට මහන්සිය හා වෙහෙස ලඟා නොවේ. ස්වර්ග වාසීන්ගේ අවම භාග්‍යයනම්, මෙම විශ්වය දස වතාවන් ලබා දීමට වඩාත් උතුම්ය.

# ඉස්ලාමීය ස්ත්‍රීන්ගේ ස්ථාවරය

ඉස්ලාම් ධර්මය ස්ත්‍රීන්ට ලබාදී ඇති අයිතිවාසිකම් පිළිබඳව දැන ගැනීමට පෙර, සමහර සමාජවල ස්ත්‍රීන්ට හිමිව ඇති ස්ථානය හා ඔවුන්ගේ ස්ථාවරය මනා ලෙස දැන ගැනීම අවශ්‍යවේ.

ග්‍රීක් ජාතීන් අතර ස්ත්‍රීන් වෙළඳ භාණ්ඩයක් ආකාරයට පිළිගනු ලැබිණ. ඔවුන්ට කිසිදු අයිතිවාසිකමක් හෝ හිමි නොවුනු අතර, සෑම අයිතිවාසිකමක්ම හිමිවූයේ පිරිමින්ට පමණි. තවද, ඔවුන්ට (සම්පත් කෙරෙහි) දෙවැනි උරුමයද, මුදල් පරිහරණය කිරීමේ අයිතියද තහනම් වශයෙන් පැවැත්වින. ඔවුන්ගේ ප්‍රකට විද්‍යාඥයෙකුවූ සෝක්‍රටීස් (Socrates) 'විශ්වයේ භයානක විනාශයට මූලික හේතුව ස්ත්‍රීන්ය. ඔවුහු භාහිරයෙන් සෞන්දර්‍ය අලංකාරයෙන් යුත් විෂ ගසකට සමානවේ. එම ගසෙන් යම්කිසි දෙයක් අනුභව කරන පක්ෂීන් එවිගසම මැරුම් දකිති' යනුවෙන් තම මතය පල කරයි.

රෝම ජාතීන් ස්ත්‍රීය පණ නැති වස්තුවක් වශයෙන් සිතූහ. ඔවුන් අතර ස්ත්‍රීන්ට කිසියම් වටිනාකමක් හෝ අයිතිවාසිකමක් හෝ නොහිමිවිය. ස්ත්‍රීන් පණ නැති දේ ලෙස ඔවුන් සැළකූ නිසා ඔවුන්ගේ ශරීරය මත උණුකරන ලද තෙල් වැක්කරමින්ද, කුළුනු මත බැඳ තබාද වද කළහ. මෙපමණක් නොව කිසියම් වරදක් හෝ නොකළ ස්ත්‍රීන්ද අශ්වයන්ගේ වලිගයේ බැඳ ඔවුන් මරණය දකින තරමට අධික වේගයෙන් ඒවා පදවන්නට වූහ.

ස්ත්‍රීන් පිළිබඳ ඉන්දියානුවන්ගේ බැල්මද මෙසේම පැවැත්විත. නමුත්, ඔවුන් මෙයටත් වඩා ඉහළට ගොස් සැමියෙකු නැසී ගියේනම්, ඔහුගේ චිතකයේම ඔහුගේ බිරිඳද දවන්නට වූහ. තවද, චීන වැසියන්, ස්ත්‍රීන් තම සෞභාග්‍යයන් හා සම්පත් සෝදා විනාශ කරන ජලයට ඔප්පු කළහ. ඔවුන්ට තම බිරිඳන් පණපිටින්ම වැළලීමේ හා විකිණීමේ අයිතියද හිමිව තිබින.

යුදෙව්වරුන්, ස්ත්‍රීන් සාපයට ලත් අය සේ සැළකූහ. කුමක් නිසාදයත්,ඇය නබි ආදම් (අලෛ) තුමාව නොමගට යොමුකොට (තහනම්වූ) ගසෙන් අනුභව කිරීමට මග පෙන්වූ බවත්, ස්ත්‍රීය මසප්වූවිට තිවසද ඇය අල්ලන දෙයද කිළිටු කරන අපවිත්‍ර වත් තියෙකු ලෙසත් සිතූහ. ඇයට සහෝදරයන් සිටීනම්, තම පියාගේ ධනයෙන් කිසිවක් ඇයට හිමිකම් නොලැබෙන බවද සිතූහ.

ක්‍රිස්තියානි ජාතීහු, ස්ත්‍රීත්ව ෂෙතාන් (සාතන්) ලෙස සැළ කූහ. ක්‍රිස්තියානි ආගමික උගතෙකු 'ස්ත්‍රීන් මිනිස් ජාතියටම අයත් නොවන්නන්' බව පැවසීය. විශාරද ශුද්ධ. බූනා වෙන්චූර් (St.Buena venture) මහතා 'ඔබ ස්ත්‍රියෙක් දුටුවේනම්, ඇය මිනිස් ජාතියට අයත් නැතැන්තිය බව හෝ පණ ඇති දෙයක් ලෙස හෝ නොසිතන්න. සැබැවින්ම ඔබලා දකින්නේ සාතන්ගේ රූපය බවත්, ඔබලා සවන්දෙන ඇගේ කටහඬ සර්පයා ගොර වන නාදය බවත්' පවසන්නේය. තවද, පසුගිය 19 වැනි සියවසේ මැද භාගය තෙක් ඉංග්‍රීසීන්ගේ සාමාන්‍ය නීතිය අනුව ස්ත්‍රීන් ප්‍රජා අයිතිය ලද අය බව නොසැළකීය. එමෙන්ම ස්ත්‍රීන්ට කිසි යම් මිනිස් අයිතිවාසිකම්ද, ඇය පළඳින ඇඳුම් පැළඳුම් ඇතුළු යම්කිසි දෙයකට හෝ උරුමකම්ද ඇයට නොහිමිව තිබින.

1567 වන වසරේ ස්කොට්ලන්ත පාර්ලිමේන්තුව (Scottish Parliament) 'ස්ත්‍රීන්ට කිසියම් දෙයකට හෝ බලයක් නොදිය යුතුයි' යනුවෙන් නීතියක් පැනවිය. තවද, අටවැනි හෙන්රිගේ (Henry VIII) කාලයේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව (British Parliament) ස්ත්‍රීන් අපිරිසිදු අය බැවින් බයිබලය පාරායනා නොකළ යුතුයි' යනුවෙන් නීතියක් සම්මත කළේය. ප්‍රංශ ජාතීන් 586 වැනි වසරේදී 'ස්ත්‍රීන් මිනිස් සංහතියට අයත්ද, නැද්ද' යනු වෙන් සමීක්ෂණයක් කිරීම සඳහා කමිටුවක් පත් කළහ. මවුහු ස්ත්‍රීන් මානව සංහතියට අයත්වූ නමුත්, මවුන් මවන ලද්දේ පිරිමින්ට ආවතේව කිරීම සඳහා බව තීරණය කළහ. වර්ෂ 1805

දක්වා ඉංග්‍රීසීන්ගේ නීතිය අනුව, සැමියෙකුට තම බිරිඳ විකිණී මේ අයිතියද තිබිත. බිරිඳගේ වටිනාකම පැන්ස් හයක් එනම්, සිලිං භාගය (Six Pence ie Half Shilling) යනුවෙන් නිගමනයද කළ සිටියහ. (පැන්ස් හා ෂිලිං යනුවෙන් හැඳින්වන් නේ පැරණි ඉංග්‍රීසි කාසිවල නමය)

ඉස්ලාම් ධර්මය පැමිණෙන තෙක් අරාබිවරුන් අතරේ ස්ත්‍රීන් නින්දිත වස්තුවක් ලෙසද, සම්පත් හිමිකම් ලැබීමට සුදුස්සන් නොවන අය ලෙසද, කිසිඳු සැළකීමක් නොලද අය ලෙසද, ඔවුන් කිසිඳු අයිතිවාසිකම් නොමැති අය ලෙසද පිළිගැනීමක් තිබිණ. මෙපමණක් නොව, ඔවුන්ගෙන් අධික පිරිස් තම දියණීන් පණ පිටින් වළලන්නන් ලෙසද සිටියහ.

මෙකී සැම අපරාධවලින් ස්ත්‍රීන් මුදාහැරීම සඳහාද, ස්ත්‍රීන් හා පිරිමින් සමාන වන්නයින් බවත් පිරිමින්ට සේම ස්ත්‍රීන්ටද අයිතිවාසිකම් හිමිව ඇති බවත් පැහැදිළි කිරීම සඳහාද ඉස්ලාම් ධර්මය උදාවීය. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿يا أيها الناس إنا خلقناكم من ذكر و أنثى وجعلناكم شعوبا وقبائل لتعارفوا،
إن أكرمكم عند الله أتقكم﴾ [الحجرات:١٣]

මිනිසුනි, නිසැකයෙන්ම අපි ඔබ එක් පිරිමියෙකු හා එක් ස්ත්‍රියෙකු මාර්ගයෙන් මැව්වෙමු. ඔබලාගෙන් එකිනෙකා හඳුනා ගැනීම පිණිස විවිධ ගෝත්‍රයන් හා සමාජයින් ලෙස බිහි කළෙමු. (එහෙයින්) ඔබලාගෙන් කවරෙකු බිය භක්තිකයා ලෙස සිටින් නේද, අල්ලාහ් වෙත ඉමහත් ගෞරවනීය වන්නයා හෙතම මහු මයවේ. *(අල්කුර්ආන්-49:13)*

﴿ومن يعمل من الصالحات من ذكر أو أنثى وهو مؤمن فأولئك يدخلون
الجنة ولا يظلمون نقيرا﴾ [النساء:١٢٤]

එබැවින්, පිරිමින් හෝ ස්ත්‍රීන් හෝ වේවා කවරෙකු විශ්වාසය කර, කුසල් කාර්යයන්හි යෙදෙන්නේද, ඔවුන් ස්වර්ගයට පිවිසෙති. තවද, ඔවුන් සුළු වශයෙන් හෝ නින්දාවටලක් නොවෙති.
(අල්කුර්ආන්- 4:124)

﴿ووصينا الإنسان بوالديه حسنا...﴾ [العنكبوت :٨]

තම දෙමාපියන්හට උපකාර (කුසල්) කරන මෙන් අපි මිනිසුන්ට අණකර ඇත්තෙමු. (අල්කුර්ආන්-29:8)

මේ ගැන නබි මුහම්මදු (සල්) තුමාද මෙසේ පවසන්නේය.

[أكمل المؤمنين إيمانا أحسنهم خلقا، وخياركم خياركم لنسائهم]

(رواه الترمذي)

විශ්වාසීන් අතර පරිපූරණ විශ්වාස වන්තයා යහපත් ගුණාංග යෙන් සිටින්නාය. ඔබ බිරිඳන් අතර ශ්‍රේෂ්ඨයා, හෙතම ඔබලා අතර ශ්‍රේෂ්ඨයා මහුමය. (තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)

[سأل رجل النبي ﷺ فقال : من أحق الناس بحسن صحابتي ؟ قال : أمك، قال : ثم من ؟ قال : أمك ، قال: ثم من ؟ قال : أمك، قال : ثم من ؟ قال : أ بوك] (رواه البخاري ومسلم)

පුද්ගලයෙකු මුහම්මදු (සල්) තුමාගෙන් 'මිනිසුන් අතර මිත්‍රත්වය පැවැත්වීමට සුදුස්සා කවරෙකුද ?' යනුවෙන් ඇසීය. එයට එතුමා 'ඔබේ මවය' යනුවෙන් කීය. පසුව කවරෙකුද ? යනුවෙන් ඇසීය. එතුමා 'ඔබේ මවය' යනුවෙන් පැවැසීය. පසුව කවරෙකුද? යනුවෙන් ඇසීය. එයටද එතුමා 'ඔබේ මවය' යනුවෙන් පැවසීය. පසුව කවරෙකුද? යනුවෙන් මහු නැවත ඇසීය. එයට නබිතුමා 'ඔබේ පියාය' යනුවෙන් පැවසීය.

(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

මේවා ඉස්ලාම් ධර්මයෙහි ස්ත්‍රීන්ගේ ස්ථාවරය පිළිබඳ කෙටි බැල්මකි.

## ස්ත්‍රීන්ගේ පොදු අයිතිවාසිකම්

ඉස්ලාම් ධර්මය ස්ත්‍රීන්ට පොදු අයිතිවාසිකම් කීපයක් ලබාදී ඔවුන්ට සමාජයෙහි ගරුත්වය ලබා දී ඇත. එම අයිතිවාසිකම් මෙසේය.

### 1-සම්පත් සතු කිරීමේ අයිතිය

ස්ත්‍රීන්හට නිවෙස්, ඉඩම්, කර්මාන්ත ශාලා, වතු, රත්රන්, රිදී හා සිව්පාවන් වැනි කැමැති දෙයක් තමන් සතු කිරීමේ අයිතිය හිමිවේ. ඔවුන් බිරිඳ හෝ මව හෝ දියණිය හෝ සහෝදරිය හෝ විය හැක.

### 2-විවාහවීමේ අයිතිය

තම සැමියාව තෝරා ගැනීම, තමාට කැමැති නොවන අය ප්‍රතික්ශේප කිරීම හා තමාට හානි සිදුවන අවස්ථාවන්හි දික්කසාදය ලබා ගැනීම යනාදී අයිතීන් ස්ත්‍රීන්ට හිමිව ඇත. මේවා ස්ත්‍රීන්ට අයත් ස්ථිර අයිතීන්ය.

### 3-ඉගෙන ගැනීමේ අයිතිය

අල්ලාහ් පිළිබඳවද, ඔහුට කළ යුතු ඇදහීමයන් හා එය ඉටු කළ යුතු ආකාරයද, ඔවුන්ට අනිවාර්යවූ කාර්යයන්ද, ඔවුන්ට අවශ්‍ය සිරිත් විරිත්ද, ශ්‍රේෂ්ඨ ගුණාංගයන්ද යන ඔවුන්ට අනිවාර්යවූ සෑම දේ ඉගෙන ගැනීමේ අයිතිවාසිකම ස්ත්‍රීන්ට හිමිව ඇත. මක්නිසාදයත්, අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿فاعلم أنه لا إله إلا الله﴾ [محمد: ١٩]

එබැවින්, නිශ්චයෙන්ම, වන්දනාමානය කිරීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොවන බව ඔබ දැන ගන්න.
*(අල්කුර්ආන්-47:19)*

නබි මුහම්මද් (සල්) තුමා මෙසේ පවසන්නේය.

[طلب العلم فريضة على كل مسلم] (رواه ابن ماجة)

අධ්‍යාපන දැනුම් ඥානය ලබාගැනීම සෑම මුස්ලිම් පිරිමින් හා ස්ත්‍රීන්ට අනිවාර්ය කරුණකි. *(ඉබ්නු මාජා ග්‍රන්ථය ඇසුරෙනි)*

## 4-වියදම් කිරීමේ අයිතිය

තම මුදලින් තමා කැමැති දේ පිං කිරීමටත්, තමා වෙනුවෙන් හා තම සැමියා, දරුවන් හෝ දෙමාපියන්ගෙන් තමා කැමැති අය වෙනුවෙන්ද නාස්තිය නොවන පරිදි වියදම් කිරීමේ අයිතිය ස්ත්‍රීන්ට තිබේ. මෙම කාර්යයෙහි ස්ත්‍රීන් පිරිමීන්ට සමානවේ.

## 5-මරණ සාසන අයිතිය

තම ධනයෙන් තුනෙන් එක කොටසක් තම ජීවිත කාලයේදී අවසන් කැමැති පත්‍රයේ ලිවීම හා එය ඇයගේ මරණයෙන් පසු ප්‍රතික්ශේපයෙන් තොරව ක්‍රියා කිරීම ඇයගේ අයිතීන්ය. මක් නිසාදයත්, අන්තිම කැමැති පත්‍රය ලිවීම මිනිස් අයිතිවාසිකමකි. මෙය පිරිමින්ට සේම ස්ත්‍රීන්ටද හිමිවේ. නමුත්, මරණ සාසනය තුනෙන් එක පංගුවට වඩා නොවැඩිවීම කොන්දේසියෙකි. මෙහිදී පිරිමින් හා ස්ත්‍රීන් සමානවේ.

## 6-ඇඳුම් පැළඳීමේ අයිතිය

ස්ත්‍රීන් සේද ඇඳුම් හා රත්රන් පැළඳිය හැක. මේවා පිරිමීන්ට තහනම්ය. අවසරයලද අය ඉදිරියෙහි හැර ස්ත්‍රිය නිර්වස්ත්‍රයෙන් සිටීම තහනමය.

## 7-අලංකාරකිරීමේ අයිතිය

ස්ත්‍රීන් තම සැමියන් සඳහා තමාව අලංකාර කරගැනීමේ අයිතිය හිමිවේ. ඔවුන් සිර්මා (Kohl) ගෑම, කැමැතිනම් කම්මුල් දෙක හා තොල් දෙකට රතු පැහැය ආලේප කිරීම, ඉතා ලස්සන ආභරණයන් පැළඳීම යනාදීන් කළ හැක.

## 8-ආහාර පානය කිරීමේ අයිතිය

රසවත් හා සුවඳ ලත් ආහාර පාන අනුභව කිරීමේ අයිතිය ස්ත්‍රීන්ට හිමිවේ. ආහාර පානය කිරීමෙහි ස්ත්‍රී පුරුෂයන්ට කිසිදු භේදයක් නොමැත. පොදුවෙන් පිරිමින්ට අනුමතවූ සියල්ල ස්ත්‍රීන්ටද අනුමතවේ. එසේම පිරිමින්ට තහනම්වූ සෑම දේ ස්ත්‍රීනටද තහනම්වේ. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿وكلوا واشربوا ولا تسرفوا، إنه لا يحب المسرفين﴾ [الأعراف : ٣١]

තවද, අනුභව කරන්න. පානය කරන්න. නාස්තිය නොකරන්න. මක්නිසාදයත්, අල්ලාහ් (සීමා ඉක්මවා) නාස්ති කරන්නන් ප්‍රිය නොකරයි. *(අල්කුර්ආන්-7:31)*

මෙම ආඥාව ස්ත්‍රී පුරුෂ දෙපිරිසටම පොදුය.

## 9-දෙවැනි උරුමය

ස්ත්‍රීන්ට තම දෙමාපියන් හා සැමියන්ගේ මරණයෙන් පසු ඔවුන්ගේ සම්පත්වලට දෙවැනි අයිතිවාසිකමද, තම සම්පත්වලින් මරණයෙන් පසු තම ඥාතීන්ට උරුමකිරීමේ අයිතියද ඇත්තේය.

# සැමියාගෙන් බිරිඳගේ අයිතිවාසිකම්

ස්ත්‍රියෙකුට තම සැමියාගෙන් ලැබිය යුතු පෞද්ගලික අයිතිවාසිකම් තිබේ. මේවා ඇය තම සැමියාට අනිවාර්යව කළ යුතු සමහර පෞද්ගලික යුතුකම් සඳහා ප්‍රතිකාර වන්නේය.

මේවා බිරිඳ තම සැමියාට අනිවාර්යයෙන් කළ යුතු සමහර වගකීම්ය. අල්ලාහ් මේ ගැන මෙලෙස පවසන්නේය.

﴿ولهن مثل الذى عليهن بالمعروف﴾ [البقرة :٢٢٨]

සැමියන්ට බිරිඳන්ගෙන් (ලැබි යුතු) අයිතිවාසිකම් තිබෙන සේම, නිසි පරිදි බිරිඳන්ටද මවුන්ගෙන් (ලැබිය යුතු) අයිතිවාසි කම් තිබේ. *(අල්කුර්ආන්-2:228)*

බිරිඳට අයත් අයිතිවාසිකම් සියල්ල පරිපූර්ණයෙන් ලබා දීම සැමියාට අනිවාර්යවේ. එයින් සමහරයන් සඳහා බිරිඳ කැමැති නම් සමාව දී ඉවසා සිටීමටද හැක.

1- තම පොහොසත් හා අපොහොසත්කම අනුව ඇයට වියදම් කළ යුතුයි. ඇය තම ඇඳුම් පැළඳුම්, කෑමබීම, වෙදකම් හා වාසස්ථානය යනාදීන් සඳහා අවශ්‍ය වියදම සැමියාගෙන් ලබා ගත හැක.
2- ඔහු තම බිරිඳගේ ගෞරවය, ශරීරය, ධනය, ආගම යනාදීන් ආරක්ෂා කළ යුතුයි.
3- ඇයට අවශ්‍ය ආගමික දැනුම ලබාදිය යුතුයි. ඔහු එයට අපහසු වන්නේනම්, දේවස්ථාන හෝ පාසැල් හෝ වෙනත් ස්ථානවල පවත්වන ස්ත්‍රීන්ට අයත් ආගමික පන්තිවලට ගොස් අධ්‍යාපන දැනුම් ඥානය ලබා ගැනීම සඳහා ඇයට අවසරය ලබා දිය යුතුයි. නමුත්, එම ස්ථානයේදී කරදරයන් හා ඔහුට හෝ ඇයට බාධාවන් නොවන බවට වග බලාගත යුතුයි.
4- ඇය සමග යහපත් ශීලයෙන් හැසිරිය යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وعاشروهن بالمعروف﴾ [النساء :١٩]

තවද, මවුන් හා සමග ආදරයෙන් (යහපත් ශීලයෙන්) හැසිරෙන්න. *(අල්කුර්ආන්-4:19)*

සංසර්ගයේදී ඇයට අයත් අයිතිවාසිකම පැහැර නොහැරීම, බැණ වැදීමෙන් හෝ පහත් කමින් කථා කිරීමෙන් වේදනා නොකිරීම හා අවනම්බු නොකිරීම යනාදීන් ඔහුට අයත් යහ

පත් ශීලයේ ගුණාංගයන්ය. තවද, ඇය තම ඥාතීන් මුනගැසී මෙන් කරදරයක් නොවන්නේනම්, එය නොවළක්වා සිටීම, ඇයට කළ නොහැකි කාර්යයන් කෙරෙහි ඇයට ශ්‍රමයන් නොදීම, කථාවෙන් හා ක්‍රියාවෙන් ඇය සමග කීකරුවෙන් හැසිරීම යනාදීන් යහපත් භාවයෙන් හැසිරීමෙකි. මක්නිසාද යත්, නබි මුහම්මද් (සල්) තුමා මෙසේ පවසන්නේය.

[خيركم خيركم لأهله ، وأناخيركم لأهلي ] (أخرجه الترمذي)

කවරෙකු තම බිරිඳ ඉදිරියේ ශ්‍රේෂ්ඨයා වන්නේද, ඔබලා අතරේ ශ්‍රේෂ්ඨයා ඔහුමය. ඔබලා අතර, මා මාගේ බිරිඳ ඉදිරියේ ශ්‍රේෂ්ඨ වන්නයාය. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

## හිජාබ් පැළඳීම

නිසැකයෙන්ම, ඉස්ලාම් ධර්මය පවුල විහිදී නොයා ආරක්ෂා කිරීමට උනන්දුව දක්වයි. එම පවුලෙහි මනෝ ආශාවන් රුකුල් දීමද, ස්වභාවික පරිසරයට හානි වීමද නොවන පරිදි මිනිසුන් ආරෝග්‍යයෙන්ද සමාජයේ පවිත්‍රතාවයෙන්ද ජීවත්වීම උදෙසා ඉස්ලාම් ධර්මය යහපත් ගුණාංග හා පිළිවෙතින් යුත් ශක්තිමත් කුළුණු මගින් වටකර තාප්පයක් තනා ඇත. කරදරයන් කෙරෙහි අවධානය යොමුකරන කාර්යයන් වළක්වාලීම සඳහාද ආවරණ ඇතිකර ඇත. පිරිමින් හා ස්ත්‍රීන් තම බැල්ම පහත හෙළිය යුතු බවද ඉස්ලාම් ධර්මය ආඥා කරයි.

නිසැකයෙන්ම, අල්ලාහ්, ස්ත්‍රීන්ට හිජාබය පැළඳීම, මවුන්ට ගෞරවයක් වශයෙන්ද, නින්දාවීමෙන් තමන්ගේ කන්‍යාභාවය ආරක්ෂාකර ගැනීම සඳහාද, නපුරු හා අයහපත් ශිලින්ගෙන් මවුන් ඈත්වීම සඳහාද, මවුන්ගේ වටිනාකමේ, මැනීමේ ශ්‍රේෂ්ඨ භාවය නාඳුනන අයගෙන් ආරක්ෂාකර ගැනීම සඳහාද, විෂ බැල්මට හේතුවන ප්‍රශ්නයෙහි දොරටු වසා ගැනීම සඳහාද, ගරුත්ව කුළුණු මගින් මවුන්ගේ ගෞරවය හා පතිවෘත්ත භාවය රැක ගැනීම සඳහාද අනිවාර්ය කරයි.

ඉස්ලාම් ධර්මය ස්ත්‍රීන්හට ගෞරවනීය ආරක්ෂාවක් ලබා දීම සඳහා හිජාබය පැළඳීම අනිවාර්ය කරයි. බිරිඳකු වයසට පත්වන විට තම සෞන්දර්යයෙන් මදක් ඇයට අහිමි වන්නේය. සැමියා මාර්ගවල ගමන් කරනවිට ඔහු සම වයසට අයත් තරුණ, රූම තීය හා සෞන්දර්ය ස්ත්‍රීන් දකී. පසුව ඔහු තම බිරිඳ වෙත පැමිණවිට තම බිරිඳ එම ස්ත්‍රීන් හා සමග සසඳා බැලීමට පටන් ගනී. මෙයින් නිවසතුල එනම් සැමියා හා බිරිඳ අතාහෙිර කරදර හා ප්‍රශ්න ඇතිවේ.

# බහු භාර්යා සේවනය

මානව සංහතිය උදාවීමෙන් සමගම බහු භාර්යා සේවනය ආරම්භවිය. එනම්, පැරණි ආගම්වල හා පැරණි සමාජවල මෙම බහු භාර්යා සේවනය පැවැත්විණ. ක්‍රිස්තියානි හා යුදෙව් සමාජ වලද, චීනය, ඉන්දියාව හා මෙවැනි රටවලද බහු භාර්යා සේවනය දක්නට ලැබිණ.

පිරිමින් තමන් කැමතිවන ස්ත්‍රීන් විවාහ කිරීමට පටන් ගත් හෙයින් බහු භාර්යා සේවනය සීමාවකින් තොරව පැවැත්වන්නට විය. එපමණක් නොව, මෙමගින් ස්ත්‍රීන් වද හිංසාවලටද ලක්වන්නට වූහ. එනිසා ඉස්ලාම් ධර්මය පැමිණීමෙන් ස්ත්‍රීන්ට සිදුවූ අපරාධයන් තුරන්කරමින්, සතරකට නොවැඩිවන සේ බහු භාර්යා සේවනය සීමා කළේය. ඉස්ලාම් ධර්මය බහු භාර්යා සේවනය අනුමත කළ ඇති අතර, බිරිඳන් අතර යුතුකමෙන් හා නීතියෙන් හැසිරිය යුතු බව කොන්දේසියක්ද පනවා ඇත.

එසේම, මෙම කොන්දේසිය කඩ නොකරන ලෙසට තරයේම අවවාද කරන අතර, මෙය කඩ කරන්නාට දැඩි ලෙස දඬුවමද නියමකර ඇත.

මිනිසා බහු භාර්යා සේවනය කෙරෙහි අවශ්‍යවන අවස්ථාද ඇත. උදාහරණයක් වශයෙන්, බිරිඳ වඳ ස්ත්‍රියකුවීමෙන් හෝ රෝගියෙකුවීමෙන් හෝ මෙවැනි තත්ත්වයෙහි සිටීමෙන් එවන් ස්ත්‍රියට සුදුසු විසඳුම කුමක්ද? ඇගේ සැමියා ඇයව දික්කසාද

කිරීමද? නොඑසේනම්. සැමියා තම බිරිඳ දික්කසාද නොකරමින් ඇය සමග වෙනත් විවාහයක් කරගැනීමද ?

යුද්ධය හා මෙවන් හේතූන් මත ස්ත්‍රීන්ගේ සංඛ්‍යාව වැඩිවන නිසා බහු භාර්යා සේවනය මගින් සමාජ ශීලාචාරය පවතින්නේය. ප්‍රථම ලෝක යුද්ධය යුරෝපාවෙහි කෝටි දෙක හමාරක (2,50,00000) වැන්දඹුවන් බිහි කළේය. මෙවන් වැන්දඹුවන්ට ශ්‍රේෂ්ඨවන්නේ විවාහයෙන් තොරව ජීවත්වීමද ? නොඑසේනම්, විවාහක සැමියෙකුට දෙවැනි බිරිඳ ලෙස ජීවත්වීමද ? 1945 වර්ෂ සිදුවූ දෙවැනි ලෝක මහා යුද්ධයෙන් පසු ජර්මන් රටේ ස්ත්‍රීන් පෙළපාලියකින් ගොස්, ජර්මානිය ස්ත්‍රීන් ගණිකා වෘත්තියෙන් ආරක්‍ෂා කිරීම සඳහා බහු භාර්යා සේවනය අනුමත කරන පණතක් නීති සම්පාදනය කරන මෙන් ඉල්ලීමක් ඉදිරි පත් කළහ.

# ඉස්ලාම් ධර්මයෙහි පිවිසීම

ඉස්ලාම් ධර්මයේ විශේෂත්වය ගැනද, අල්ලාහ් වෙත ජයග්‍රහනය ලබා දීමට අයත් එකම මාර්ගය ඉස්ලාම් බවද, ඉස්ලාම් ධර්මයතුල පිවිසීම සෑම මිනිසෙකුටම අනිවාර්ය බවද, ස්වර්ගයෙහි පිවිසීමට හා පරලොව දිනයෙහි නරකාදියෙන් නිදහස්වීමට ඉස්ලාමය වෙළා ගැනීමෙන් තොර කිසිඳු මගක් නොවන බවද වටහා ගැනීමෙන් පසු, ඉස්ලාම් ධර්මයතුල පිවිසීමේ කෙසේද ? යනු වෙන් ප්‍රශ්න කළ හැක.

මෙම ප්‍රශ්නයට පිළිතුරක්නම්, ඉස්ලාමය තුල පිවිසීමට අදහස් කරන්නා, **ලාඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහ්** එනම්, වන්දනාමානයන් යොමු කිරීමට සුදුසු එකම දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බවත්, නබි මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ රසූල් හෙවත් පණිවිඩකරුවා බවත් විශ්වාස කර එය මුඛයෙන් ප්‍රකාශ කළ යුතුයි. පසුව, ඉස්ලාම් ධර්මය පිළිබඳව ඉගෙන ගැනීමට හා සලාතය හෙවත් නැමදුම වැනි ඉස්ලාම් ධර්මයෙහි අනිවාර්ය කරුණු ක්‍රියාවෙහි යෙදීමට ආරම්භ කළ යුතුයි.

# محتويات الكتاب

# පටුන



| විෂය | පිටුව |
|---|---|
| 1- ප්‍රාරම්භය | 3 |
| 2-මිනිස් නිර්මාණය කුමක් සඳහාද ? | 5 |
| 3-ඉස්ලාමය යනු කුමක්ද ? | 6 |
| 4-මිනිස් සංහතියේ ඉතිහාසය | 6 |
| 5-නබි මුහම්මදු (සල්) තුමා | 10 |
| 6-ඉස්ලාම් ධර්මයෙහි පදනම | 23 |
| 7-ඉස්ලාම්හි වන්දනාමානය | 29 |
| 8-ඉස්ලාම්හි අනිවාර්ය කරුණු | 30 |
| 9-ඉස්ලාම් ධර්මයෙහි පෞද්ගලිකත්වය | 33 |
| 10-ඉස්ලාම් ධර්මයෙහි විශේෂභාවය | 44 |
| 11-අවසාන දිනය | 49 |
| 12-ඉස්ලාම්හි ස්ත්‍රීන්ගේ ස්වභාවය | 65 |
| 13-ඉස්ලාම් ධර්මයෙහි පිවිසීම | 75 |